2022 අගෝස්තු 15
2022 ஆகஸ்ட் 15
15 August 2022

NAOSL

# 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 14 වන වගන්තිය ප්‍රකාරව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන විගණකාධිපති ත්‍රෛවාර්ෂික වාර්තාව


# 2018 இன் 19 ஆம் இலக்க தேசிய கணக்காய்வு அதிகாரச்சட்டத்தின் 14 ஆவது பிரிவின் பிரகாரம் பாராளுமன்றத்திற்கு சமர்ப்பிக்கப்படுகின்ற கணக்காய்வாளர் தலைமை அதிபதியின் மூன்றாண்டு அறிக்கை

# Triennial Report of the Auditor General presented in parliament in terms of Section 14 of the National Audit Act, No. 19 of 2018

එකලොස් වන කාණ්ඩය - 06 (ii)
பதினோராவது தொகுதி - 06 (ii)
Eleventh Volume - 06 (ii)

## නගර සභා
## நகர சபைகள்
## Urban Councils


ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

# 2018, 2019 හා 2020 වර්ෂ සඳහා

## ත්‍රෛවාර්ෂික වාර්තාව

# නගර සභා


## පටුන


| | හැඳින්වීම | පිටු අංකය |
|---|---|---|
| **01.** | කඩුගන්නාව නගර සභාව | **06** |
| **02.** | ගම්පොළ නගර සභාව | **06** |
| **03.** | නාවලපිටිය නගර සභාව | **10** |
| **04.** | වත්තේගම නගර සභාව | **13** |
| **05.** | තලවාකැලේ ලිඳුල නගර සභාව | **13** |
| **06.** | හැටන් දික්ඔය නගර සභාව | **14** |
| **07.** | හපුතලේ නගර සභාව | **15** |
| **08.** | වැලිගම නගර සභාව | **16** |
| **09.** | හික්කඩුව නගර සභාව | **16** |
| **10.** | තංගල්ල නගර සභාව | **17** |
| **11.** | ඇඹිලිපිටිය නගර සභාව | **18** |
| **12.** | කෑගල්ල නගර සභාව | **20** |
| **13.** | ජාඇල නගර සභාව | **22** |
| **14.** | කටුනායක සීදූව නගර සභාව | **24** |
| **15.** | මීනුවන්ගොඩ නගර සභාව | **28** |
| **16.** | වත්තල මාබෝල නගර සභාව | **30** |
| **17.** | පානදුර නගර සභාව | **33** |
| **18.** | හොරණ නගර සභාව | **34** |
| **19.** | කැස්බෑව නගර සභාව | **35** |
| **20.** | සීතාවකපුර නගර සභාව | **36** |
| **21.** | කුලියාපිටිය නගර සභාව | **38** |
| **22.** | හලාවත නගර සභාව | **38** |
| **23.** | අම්පාර නගර සභාව | **39** |
| **24.** | වවුනියාව නගර සභාව | **39** |
| **25.** | කින්නියා නගර සභාව | **40** |
| **26.** | ත්‍රිකුණාමලය නගර සභාව | **40** |
| **27.** | එරාවූර් නගර සභාව | **42** |
| **28.** | කාත්තන්කුඩි නගර සභාව | **43** |
| **29.** | වැල්වැටිතුරේ නගර සභාව | **44** |
| **30.** | චාවකච්චේරි නගර සභාව | **44** |
| **31.** | පේදුරුතුඩුව නගර සභාව | **45** |

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ නීති ප්‍රඥප්ති සංග්‍රහය 255 වන අධිකාරිය මගින් 1939 අංක 61 දරන ආඥා පනතේ සිට 1987 අංක 18 දරන පනත දක්වා පනත් ඒකාබද්ධ කර ශ්‍රී ලංකාවේ පළාත් පාලන කාර්යයන් සඳහා නගර සභා පිහිටුවීම පිණිස විධිවිධාන සලස්වා ඇත. මෙ වනවිට දිවයින තුළ නගර සභා 41 ක් ස්ථාපනය කොට ක්‍රියාත්මක වෙමින් පවතී.

නගර සභාවලට අයත් මූලික කර්තව්‍ය වනුයේ නගරයේ මහජන සෞඛ්‍ය, මහජන උපයෝගී සේවා, පොදු මංමාවත් පිළිබඳ සියළුම කාරණා නගරයේ සීමා තුළ විධිමත් කිරීම, පාලනය කිරීම සහ පරිපාලනය කිරීමද, සාමාන්‍යයෙන් මහජනයාගේ සුබ විහරණය, පහසුකම්, සුභ සාධන කටයුතු හා නගරයේ සුබ විහරණ ක්‍රම ආරක්ෂා කිරීම හා වැඩි දියුණු කිරීම වේ. නගර සභාවල ප්‍රධාන සංයුතිය වනුයේ නගර සභාපතිවරයාගෙන්, උප සභාපතිවරයාගෙන්ද, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයන් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන යම් සංඛ්‍යාවකින් යුක්ත වන අනෙකුත් සභික සංඛ්‍යාවකින් සමන්විත වේ.

ශ්‍රී ලංකාව තුළ ප්‍රධාන පළාත් සභාවන් ආවරණය වන පරිදි නගර සභා හතළිස් ඒකකින් සමන්විත වේ. බස්නාහිර පළාත සඳහා නගර සභා 14 ක්ද, මධ්‍යම පළාත් සඳහා නගර සභා 6 ක්ද, නැගෙනහිර පළාත සඳහා නගර සභා 5 ක්ද, උතුරු පළාත සහා නගර සභා 5 ක්ද, දකුණු පළාත සඳහා නගර සභා 4 ක්ද, , වයඹ පළාත සඳහා නගර සභා 3 ක්ද, සබරගමුව පළාත සඳහා නගර සභා 3 ක්ද, ඌව පළාත සඳහා නගර සභා 1 ක්ද, බැගින් පිහිටුවා ඇත. කෙසේ වුවද, මොණරාගල දිස්ත්‍රික්කය, පොළොන්නරුව දිස්ත්‍රික්කය, අනුරාධපුරය දිස්ත්‍රික්කය හා කිලිනොච්චිය දිස්ත්‍රික්කය තුළ මෙතෙක් නගර සභා පිහිටුවා නොමැත. පහත රූපසටහන ප්‍රකාරව පළාත් අනුව මෙම නගර සභාවල ව්‍යාප්තිය දැක්වේ.




(ඡායරූපය 1)

2018, 2019 හා 2020 වර්ෂ තුන සඳහා නගර සභා 41 ක මූල්‍ය ප්‍රකාශන ප්‍රකාරව සමස්ථ ආදායම රුපියල් මිලියන 23,321 ක් වූ අතර, මෙම වර්ෂ තුන සඳහා මූල්‍ය ප්‍රකාශන ප්‍රකාරව සමස්ථ වියදම රුපියල් මිලියන 22,375 ක් විය. 2018 වර්ෂයට සාපේක්ෂව 2020 වර්ෂය වනවිට මෙම නගර සභා 41 හි ආදායම වර්ධන 11.9 % ක් වූ අතර, එම වර්ෂයට සාපේක්ෂව වියදමේ වර්ධනය 10.5 % ක් විය. 2018 වර්ෂයේ නගර සභා 7 ක මූල්‍ය ප්‍රකාශන ප්‍රකාරව ඌනතාවයක් පෙන්නුම් කළ අතර, එම ඌනතාවල සමස්ථ එකතුව රු. මිලියන 103 ක් විය. 2019 වර්ෂය වනවිට මෙම නගර සභා අතුරින් නගර සභා 16 ක මූල්‍ය ප්‍රකාශන ප්‍රකාරව ඌනතාවයක් පෙන්නුම් කළ අතර, එම නගර සභාවල සමස්ථ ඌනතාවය රු. මිලියන 440 ක් විය. කෙසේ වුවද, 2020 වර්ෂය වනවිට මෙම නගර සභා අතුරින් නගර සභා 10 ක මූල්‍ය ප්‍රකාශන අනුව ඌනතාවයක් පෙන්නුම් කළ අතර, එම සමස්ථ ඌනතාවය රු. මිලියන 582 ක් විය. මෙම ඌනතාවය විග්‍රහ කිරීමේදී කැපී පෙනෙන ලක්ෂණයක් වූයේ 2018, 2019 හා 2020 වර්ෂයන්හි පිළිවෙලින් කැස්බෑව නගර සභාවේ රු. මිලියන 49 ක , රු. මිලියන 58 ක හා රු. මිලියන 222 ක ඌනතාවයක් සහ කඩුගන්නාව නගර සභාවේ 2018, 2019 හා 2020 වර්ෂවලදී පිළිවෙලින් රු. මිලියන 3, රු.මිලියන 8 හා රු. මිලියන 4 ක අඛණ්ඩ ඌනතාවයක් පෙන්නුම් කිරීමයි. මෙම නගර සභා අතුරින් නගර සභා 19 ක 2018, 2019 හා 2020 වර්ෂ 3 සඳහාම අඛණ්ඩව අතිරික්තයක් පෙන්වා තිබුණි.

නගර සභා විසින් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන ප්‍රකාරව නගර සභා 41 ක් තුළ මුලු වත්කම් ප්‍රමාණය 2018 වර්ෂයේ රු. මිලියන 22,118 ක්ද, 2019 වර්ෂයේ රු. මිලියන 30,985 ක්ද, 2020 වර්ෂයේ රු . මිලියන 39,940 ක් ද වශයෙන් නියෝජනය විය. මේ අනුව 2018 වර්ෂයට සාපේක්ෂව 2020 වර්ෂය වනවිට මෙම නගර සභාවල මුලු වත්කම්වල වර්ධනය 80% ක් විය. 2018 වර්ෂයට සාපේක්ෂව 2020 වර්ෂය අවසාන දිනට කොළොන්නාව නගර සභාවේ මුලු වත්කම් ප්‍රමාණය රු. මිලියන 513 සිට රු. මිලියන 1,165 දක්වාත්, සීතාවකපුර නගර සභාවේ එම ප්‍රමාණය රු. මිලියන 235 සිට රු. මිලියන 1,038 දක්වාත්, මහරගම නගර සභාවේ එම ප්‍රමාණය රු. මිලියන 917 සිට රු. මිලියන 1,939 දක්වාත්, බොරලැස්ගමුව නගර සභාවේ එම ප්‍රමාණය රු. මිලියන 323 සිට රු. මිලියන 849 දක්වාත්, කැස්බෑව නගර සභාවේ එම ප්‍රමාණය රු. මිලියන 1,011 සිට රු. මිලියන 3,327 දක්වාත්, මිනුවන්ගොඩ නගර සභාවේ එම ප්‍රමාණය රු. මිලියන 193 සිට රු. මිලියන 1,323 දක්වාත්, කටුනායක නගර සභාවේ එම ප්‍රමාණය රු. මිලියන 443 සිට රු. මිලියන 3,175 දක්වාත් මුලු වත්කම් වටිනාකමෙහි වර්ධනයක් නිරීක්ෂණය විය. 2020 වර්ෂයේ සිට බස්නාහිර පළාත හා උතුරු මැද පළාත තුළ වූ පළාත් පාලන ආයතනවල පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුව ගිණුම් පිළියෙල කිරීම නිසා පළාත්පාලන ආයතනවල වත්කම් ප්‍රත්‍යාගණනය කර ගිණුම් තැබීම හා ඉඩම් හා ගොඩනැගිලි ගිණුම්ගත කිරීම මෙම වැඩිවීමට ප්‍රධාන ලෙස බලපා තිබුණි.

නගර සභා විසින් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන ප්‍රකාරව නගර සභා 41 න් මුලු වගකීම් ප්‍රමාණය 2018, 2019 හා 2020 වර්ෂවල පිළිවෙලින් රු.මිලියන 3,083 ක්ද, රු. මිලියන 3,753 ක්ද, සහ රු. මිලියන 4,093 ක්ද විය. කුලියාපිටිය නගර සභාවේ මුලු වගකීම් ප්‍රමාණය 2018 වර්ෂයට සාපේක්ෂව 2020 වර්ෂය වනවිට 202% කින් වර්ධනය වී තිබුණි.

2020 දෙසැම්බර් 31 දිනට නගර සභා 41 හි ශුද්ධ වත්කම් ප්‍රමාණය රු. මිලියන 35,847 ක් විය. මේ අතුරින් ගම්පොල නගර සභාව රු. මිලියන 7,147 ක වැඩිම ශුද්ධ වත්කම් ප්‍රමාණය නියෝජනය වන අතර, අඩුම ශුද්ධ වත්කම් ප්‍රමාණය නියෝජනය වූයේ කුලියාපිටිය නගර සභා වන අතර, එම ප්‍රමාණය රු. මිලියන 104 ක් විය.

නගර සභා ආඥා පනතේ (255 අධිකාරිය) 181(1) උප වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර සියලුම නගර සභා විසින් මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණි. එම 2018, 2019 හා 2020 වර්ෂයන්ට අදාලව, මූල්‍ය ප්‍රකාශන විගණනය කර විගණන පනතේ 11(1) හා 11(2) ප්‍රකාර මතය ඇතුළත් සම්පිණ්ඩන වාර්තා හා කළමනාකරණ වාර්තාවන් සියලුම සභාවන් වෙත ඉදිරිපත් කර ඇත. 2018 වර්ෂයේ නගර සභා 40 ක් සඳහා තත්ත්වාගණනය කළ මතයද, කින්නියා නගර සභාව සඳහා අහිතකර මතයද ප්‍රකාශ කර තිබුණි. 2019 හා 2020 වර්ෂවල නගර සභා 41 ක සඳහාම තත්ත්වාගණනය කළ මත ප්‍රකාශ කර තිබුණි. 2020 වර්ෂයේ නගර සභා 41 සඳහා තත්ත්වාගණනය කළ මතයද ප්‍රකාශ කර තිබුණි. සමස්ථයක් ලෙස ගත් කල 2018 වර්ෂයේ නගර සභා සඳහා 97% ක් තත්ත්වාගණනය කල මතයද, 2019 වර්ෂයේ නගර සභා සඳහා 100% ක් තත්ත්වාගණනය කල මතයද, 2020 වර්ෂයේ නගර සභා සඳහා 100% ක් තත්ත්වාගණනය කළ මතයද ප්‍රකාශ කර තිබුණි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 14 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපතිවරයා විසින් සෑම මුදල් වර්ෂ තුනක කාලසීමාවක් අවසන් වීමෙන් පසුව මාස නවයක් ඇතුළත සෑම විගණනය කරනු ලබන අස්ථිත්වයකම තත්ත්ව වාර්තාවක් පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබිය යුතුය. මෙම වාර්තාවේ ඇතුළත් විය යුතු කරුණු අතර හඳුනා ගත් ප්‍රධාන ඌනතා, ඒ සඳහා විගණකාධිපතිවරයා විසින් කරන ලද නිර්දේශ සහ විගණනය කරනු ලබන අස්ථිත්ව විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග තිබිය යුතු අතර, පාර්ලිමේන්තුවට ඒ වාර්තාව භාරදෙන අවස්ථා වනවිට ඒ පිළිබඳ පැවති තත්ත්වය ගැනද සඳහන් විය යුතුය. ඉහත පනත ප්‍රකාරව මෙතෙක් නොවිසඳී ඇති නගර සභා 31 ක විගණන නිරීක්ෂණ පහත දක්වා ඇත.

## 01. කඩුගන්නාව නගර සභාව

| | විගණන නිරීක්ෂණය ---------------------------- | විගණකාධිපතිගේ නිර්දේශය ------------------- | ආයතනය විසින් ගනුලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග ------------------ | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය --------------- |
|---|---|---|---|---|
| | කොළඹ නුවර මාර්ගයේ පිහිටි පැරණි නගර සභා ගොඩනැගිල්ල පිහිටි ඉඩම සඳහා දුම්රිය දෙපාර්තමේන්තුවට මේ වන විට රු.3,376,337 ක බදු මුදලක් ගෙවා තිබුණද එම ගොඩනැගිලි කිසිදු ඵලදායී ක්‍රියාමාර්ගයකට යොමු නොකර නිෂ්කාර්යව පවතී. | බදු මුදල් ගෙවා ලබාගත් දේපලවලින් නිසි පරිදි ආදායම් ලබා ගැනීමට කටයුතු කළ යුතු වීම. | මෙම ඉඩම නගර සභාවට අවශ්‍ය බැවින් බදු මුදල් ගෙවා ඇත. | නිශ්කාර්යව පවතී. |
| 02. ගම්පොළ නගර සභාව | | | | |
| (අ) | නගර සභා ආඥා පනතේ 36(ඉ)(ii) වගන්තිය ප්‍රකාරව මලල ක්‍රීඩා හා ක්‍රිකට් ක්‍රීඩා සමාජය පිහිටි අක්කර 2 ක ඉඩම අනුමැතියකින් හා තක්සේරුවකින් තොරව 2003 වර්ෂයේ සිට මේ දක්වා වාර්ෂිකව රු.4,000 කට බදුදී තිබුණි. මෙම ඉඩමේ අනවසරයෙන් පෞද්ගලික නිවාස 4 ක් ඉදිකර තිබුණු අතර තවත් පර්චස් 6 ක ප්‍රමාණයක් ඔප්පු අංක 1196 මගින් රු.2,700,000 කට විකුණා තිබුණි. | විධිමත් අනුමැතියක් හා තක්සේරුවක් මත ගිවිසුම්ගතවී බදු මුදල් අය කළ යුතු වේ. | ගිවිසුම කඩ කර ඇති බැවින් සන්තකය නැවත ලබා ගැනීම සඳහා කටයුතු කරමින් පවති. | තත්ත්වය නිරාකරණය වී නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | 2015,2017 හා 2018 වර්ෂවලදී සිදුකර තිබූ තක්සේරුව මත සභාව සතු ඉඩම් කොටස් 9 ක් සඳහා ලැබිය යුතු මූලික මුදල වන රු.9,512,000 ක් අයකර නොතිබුණි. | ඉඩම් සඳහා ලැබිය යුතු මූලික මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | රු.7,600,000 කට අදාළ අය අභියාචනා ඉදිරිපත් කර ඇත. රු.270,000 කට අදාළ පැවරීම සිදු කර නොමැති අතර රු.1,596,300 කට අදාළව දුම්රිය දෙපාර්තමේන්තු වෙන් ඉඩම පැවරී නැති බැවින් මාසික කුලිය අය කරයි. | මූලික මුදල අයකරගෙන නොතිබුණි. |
| (ඇ) | පොදු වෙළඳපල කඩ කාමරවලින් රු.3,052,609 ක් ද නීතිඥ කාර්යාල සංකීර්ණයෙන් රු.299,163 ක් ද ගම්පොළ දුම්රිය මාර්ගයට ඉහළින් ඇති වෙළඳ සංකීර්ණයේ 2005 වර්ෂයේ සිට 2020 දෙසැම්බර් 31 දිනට හිඟ කඩ කුළිය රු.11,075,578 ක් ද වශයෙන් රු.14,427,350 ක් අය කරගත යුතුව පැවතුණි. | නොපමාව හිඟ ආදායම් රැස් කිරීමට කටයුතු කළ යුතු වීම. | රු.571,231.40 ක මුදලක් අය කර ඇත. | රු. 13,856,119 ක හිඟ ශේෂයක් අයවිය යුතුව පවතී. |
| (ඇ) | සභා බල ප්‍රදේශය තුළ දෛනිකව එකතුවන කසළ ටොන් 20 ක පමණ ප්‍රමාණය | ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා විධිමත් | ගම්පොල නගර සභාවට කසළ බැහැර කිරීම | විධිමත් වැඩපිළිවෙලක් සකස් කර |

| | | | | |
|---|---|---|---|---|
| | කළමනාකරණය කිරීම සඳහා විධිමත් වැඩ පිළිවෙලක් සකසා නොතිබීමේ හේතුවෙන් 2019 ජූලි මස සිට දිරන කසළ දඹුල්ල කසළ ව්‍යාපෘතියට ගෙනයාම සඳහා ඉන්ධන සඳහා රු.2,056,215 කද, කසළ සඳහා රු.2,076,000 කද වියදම් දරා තිබුණි. | වැඩපිළිවෙලක් සකස් කළ යුතු වීම. | සඳහා බිම් කොටසක් නොමැති වීම හේතුවෙන්, දඹුල්ල නගර සභාවේ කසළ අංගනය වෙත කසළ ගෙනයෑමට සිදු වී ඇති අතර, දැනට ගග ඉහළ කෝරළේ කසළ අංගනය වෙත දිරන කසළ වලින් කොටසක් යැවීමට කටයුතු කිරීම. | නොමැත. |
| (ඉ) | පොදු වෙළඳපල ඉදිකිරීමට රු.2,002,742,936 ක් වැයකර තිබුණද, ටෙන්ඩර් මඟින් බදු දී තිබුණු පොදු වෙළඳපළ කඩ කාමර 100 කට අධික ප්‍රමාණයක් ව්‍යාපාරික කටයුතු කිරීමෙන් තොරව වසා දමා තිබූ අතර, වසා දමා ඇති කඩ කාමර විවිධ විෂමාචාර ක්‍රියාවන් සඳහා යොදාගෙන තිබුණි. | සභාව සතු වත්කම් ඵලදායීව හා කාර්යක්ෂමව උපයෝජනය කරමින් අපේක්ෂිත ප්‍රතිලාභ ලබා ගැනීමට කටයුතු කළ යුතු වීම. | වාර 8 දී ටෙන්ඩර් කර ඇත. ඉදිරියේදි ටෙන්ඩර් කිරීම සඳහා කඩ 44 න් 37 ක් පමණක් සුදුසු තත්වයේ පවතී. | නිශ්කාර්යව පවතී. |

| | | | | |
|---|---|---|---|---|
| (ඊ) | ගම්පොළ උසාවි භූමියට ප්‍රවේශ මාර්ගය ඉදිකිරීමට යෝජිත නගර සභාව සතු නිල නිවාස 4 ක් පැවති පර්චස් 30.44 ක ඉඩම 2019 දෙසැම්බර් 06 දින උඩ පළාත ප්‍රාදේශීය ලේකම් වෙත භුක්තිය භාරදී තිබුණු අතර, 2018 අප්‍රේල් 05 දිනැති අංක KD/LE/1550 දරන තක්සේරු ලිපිය අනුව එම ඉඩම රු.32,000,000 ක වටිනාකමට තක්සේරු කර තිබුණද එම මුදල් 2021 ජනවාරි 15 දින වන විටත් ලැබී නොතිබුණි. | සභාවට ලැබිය යුතු මුදල් ලබා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගතයුතු වීම. | මේ සම්බන්ධයෙන් උඩපලාත ප්‍රාදේශීය ලේකම් විසින් අවශ්‍ය ඉදිරි කටයුතු කරමින් පවතී. | වන්දි මුදල් ලැබී නොමැත. |
| (උ) | මහල් 3 කින් යුත් පොදු වෙළඳපළ ගොඩනැගිල්ලක් ඉදිකිරීමට සැලැසුම් කර රු.2,000,000,000 ක් වැයකර මහල් 2 ක් ඉදිකර තිබුණු අතර, සැලැසුමේ දුර්වලතා හේතුවෙන් එම මහල් දෙකද ඌන උපයෝජිතව පැවතුණි. මෙම ගොඩනැගිල්ල ඉදිකර වසර 13 ක් ගතවී තිබුණද, ඉහළ මහල ඉදිකිරීමට කටයුතු කර නොතිබුණු අතර, කොන්ක්‍රීට් කොටස් පුපුරා එම ස්ථානවලින් වැසි ජලය කාන්දු වීම් පැවතුණි. | සභාව සතු වත්කම් ආරක්ෂා කර ගැනීමටත් ඒවා ඵලදායීව උපයෝජනය කිරීමටත් හැකිවන ආකාරයට සැලැසුම් සකස් කර ක්‍රියාත්මක කළ යුතු වීම. | 3 වන මහළ ඉදි කිරීම සඳහා දැරීමට සිදුවන පිරිවැය, නගර සභාවට දැරීමට අපහසු තත්වයක් පවතින බැවින්, ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීම සිදු නොකළ බව වාර්තා කිරීම. | අඩුපාඩුව නිවැරදි කර නොමැත. |

| 03. නාවලපිටිය නගර සභාව | | | | |
|---|---|---|---|---|
| (අ) | 2016 මාර්තු 17 දිනැති අංක 2016/03 දරන පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛයේ 1(V) වගන්තිය ප්‍රකාරව රු.1,813,799 එක්වන් මුදලක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | එකවර අයකිරීම චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරවම කළ යුතු වේ. | අවශ්‍ය කටයුතු කරමින් පවතී. | අයවීම් සිදු වී නොමැත. |
| (ආ) | සභාව සතු වෙළඳ සංකීර්ණ 6 කින් රු.33,026,495 කඩ කුලියක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | කඩ කුලිය අය කරගත යුතු වේ. | ක්‍රියාත්මක සැලැස්මක් සකස් කර ආදායම් පරික්ෂකවරුන් සඳහා වගකීම් පවරා ඇති අතර ලිපි මඟින් දැනුවත් කර අයකර ගැනීමට කටයුතු කිරීම. | අයවීම් සිදු වී නොමැත. |
| (ඇ) | සභා බල ප්‍රදේශයේ ත්‍රීරෝද රථ නැවතුම්පළවලින් රු.2,568,399 ක මුදලක් අයකර නොතිබුණි. | හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | ක්‍රියාත්මක සැලැස්මක් සකස් කර ආදායම් පරික්ෂකවරුන් සඳහා වගකීම් පවරා ඇති අතර ලිපි මඟින් දැනුවත් කර අයකර ගැනීමට කටයුතු කිරීම. | විධිමත් කර අයකිරීම් සිදුකර නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | සුපිරි වෙළඳ සංකීර්ණයේ අංක 173 දරන මිනි තියටරය 2011 අගෝස්තු 23 දින පුද්ගලයෙකු වෙත ටෙන්ඩර් කිරීමකින් තොරව දීර්ඝකාලීනව බදු දී තිබුණු අතර, ඇප සුරැකුම් හා එකවර ගෙවීමේ මුදල් රු.500,000 ක් හා මාසික කුලිය රු.284,256 ක් ද අයකර නොතිබුණි. | ඇප සුරැකුම්, එකවර ගෙවීමේ මුදල්, මාසික කුලී හා සියළු අය විය යුතු මුදල් අයකර ගත යුතු වේ. | සුපිරි වෙළඳ සංකීර්ණයේ තක්සේරු කුලිය වැඩි වීම සම්බන්බන්ධව නඩුවක් විභාග වන බැවින් කඩ කුලිය අයවීමේ ගැටළුවක් පවතී. මෙම ගැටළුව සාකච්ඡා මාර්ගයෙන් විසදා ගැනීමට කටයුතු සිදු වෙමින් පවතී. | හිඟ මුදල් අයවී නොමැත. |
| (ඉ) | සුපිරි වෙළඳ සංකීර්ණයේ කඩ කාමරවල නව තක්සේරුව ක්‍රියාත්මක නොකිරීම හේතුවෙන් රු.32,675,828 ක කඩ කුළී ආදායමක් අහිමි වී තිබුණි. | නව තක්සේරුව ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතු වේ. | නව තක්සේරුව ගෙවීමට විරෝධතා එල්ලවන බැවින් කඩ හිමියන්ගේ ඉල්ලීම මත ප්‍රතිශතමය අගයක් අඩුකොට ගෙවීම සඳහා අනුමැතියකට යොමු කොට ඇත. නඩු කටයුත්ත අවසන් වන | නියමිත කුලිය අයකර නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | | | තෙක් පැරණි හිඟය ගෙවීමට කඩ හිමියන් ඉල්ලීම් ද කර ඇත. | |
| (ඊ) | පළාත් පාලන කොමසාරිස්ගේ 2016 මාර්තු 17 දිනැති අංක 2016/03 දරන චක්‍රලේඛයේ 51 ඡේදය ප්‍රකාරව කඩ කාමර 03 කින් අයවිය යුතු රු.1,338,181 ක එක්වන් මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු බව. | අංක 50 දරන කඩ කාමරයේ හිඟයෙන් කොටසක් මේ වන විට අයවී ඇති බවත් පවතින කොවිඩ් වසංගත තත්වය මත ඉතිරි හිඟ මුදල් ගෙවීම සඳහා කල් ඉල්ලා ඇති අතර ඒ සඳහා මහ සභා අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර ඇත. | හිඟ මුදල් අයකර නොමැත. |
| (උ) | 2020 දෙසැම්බර් 31 දිනට රථ වාහන නැවතුම් ගාස්තු වලින් අයවිය යුතු හිඟය රු.1,508,020 ක් විය. | නොපමාව හිඟ ආදායම් රැස් කිරීමට කටයුතු කළ යුතු වීම. | ඉදිරියේදී ක්‍රියාත්මක සැලැස්මක් සකස් කර කටයුතු කිරීමට සැලසුම් කර ඇත. | හිඟය අයකර ගැනීමට කටයුතු කර නැත. |

| | | | | |
|---|---|---|---|---|
| 04. | වත්තේගම නගර සභාව | | | |
| (අ) | 2020 දෙසැම්බර් 31 දිනට හිඟහිටි ජල ගාස්තු රු.5,643,240 ක් වූ අතර ගිවිසුම් ප්‍රකාරව කටයුතු කර, අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ ජල ගාස්තු අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | 2019 වර්ෂයෙන් හිඟ හිටි ජල ගාස්තුවෙන් සියයට 68.04 ක ප්‍රගතියක් ද 2020 වර්ෂයෙන් හිඟ හිටි ජල ගාස්තුවෙන් සියයට 50.78 ප්‍රගතියක් ද ලබා ඇත. 2020 හා 2021 වර්ෂයන් තුළ කොවිඩ් වසංගතකාරී කාලසීමාවක් යෙදුණු බැවින් හිඟ ගාස්තු අයකර ගැනීමේ ප්‍රමාදයක් ඇත. | වර්තමානය වන විටත් නිරවුල් වී නොමැති ශේෂයක් පවතී. |
| **05.** | තලවාකැලේ ලිඳුල නගර සභාව | | | |
| (අ) | වසර 02 සිට වසර 16 දක්වා කාල පරාසයක් ගතවී තිබූ, කර්මාන්ත ණයගැතියන්ගෙන්, බෝට්ටු ආදායම්, විනෝද බදු හා විශ්‍රාම වැටුප් අත්තිකාරම් ලෙස ගිණුම් විෂයන් 04 ක් යටතේ අයවිය යුතු රු.1,739,497 ක් අයකර නොතිබුණි**.** | ලැබිය යුතු ශේෂ අයකළ යුතු වීම. | සභා තීරණයට අනුව ඉදිරි ගිණුම් සැකසීමේදී නිවැරදි කර ඉදිරිපත් කරමි. | මෙතෙක් අය වී නොමැති බව දන්වා ඇත. |

| 06. | හැටන් දික්ඔය නගර සභාව | | | |
|---|---|---|---|---|
| (අ) | සභාව සතු කඩ කාමර 426 ක් වසර 14 කින් පසු තක්සේරු කර නොතිබුණු අතර දැනට මෙම කඩ කාමරවලින් රු.100 – 2800 අතර කුලී අයකරමින් පැවතුණි. | වසර 5 න් 5 ට තක්සේරු කර අය කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | අදාළ කඩ කාමර සඳහා නව තක්සේරු කිරිමට අදාළ කටයුතු තක්සේරු දෙපාර්තමේන්තුව මඟින් ආරම්භ කර ඇත. | 2020.11.05 හා 2021.01.12 දින කඩ කාමර 336 ක් සඳහා තක්සේරු ලැබී ඇත. අනෙක් කඩකාමර සඳහා තක්සේරු ලබාගැනීම සඳහා 2021.02.16 වන දින ලිපියක් යොමු කර ඇත තක්සේරු ලැබී ඇති කඩකාමර වල නව තක්සේරු මිල අය කිරීම ආණ්ඩුකාරතුමාගේ උපදෙස් මග තාවකාලිකව නතර කර ඇත. අඩුපාඩු නිවැරදි කර නොමැත. |
| (ආ) | නගර සභා ඉඩම් දීර්ඝ කාලීනව බදු දීමේදී අවස්ථා 84 කට ආළව නගර සභා ආඥා පනතේ 36 (ඉ)(11) වගන්තිය ප්‍රකාරව අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. | නගර සභා ආඥා පනත ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | වර්තමානයේ මෙවැනි ආකාරයේ කටයුතු විධිමත් ක්‍රමවේදයට සිදු වෙමින් පවතින බව දන්වා ඇති බව | අඩුපාඩුව නිවැරදි කර නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | 2015 වර්ෂයේදී මධ්‍යම පළාතේ මාර්ග සංවර්ධන ප්‍රවාහන විදුලි බල හා බලශක්ති සහ නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශයේ ප්‍රතිපාදන රු.1,964,375 කින් වැය කර ඉදිකර තිබුණු ජීව වායු නිෂ්පාදන ව්‍යාපෘතිය නිසි අධ්‍යනයකින් තොරව ඉදිකර තිබීම හේතුවෙන් ඉදිකළ දින සිටම නිෂ්ක්‍රීයව පැවතුණි . | වත්කම් ඵලදායීව උපයෝජනය කළ යුතු වීම | ඉදිරියේදී ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරන බව දන්වා ඇත. | වැඩ නිමකර තිබුණද තවමත් ක්‍රියාත්මක තත්ත්වයේ නොපවතී. |
| **07.** හපුතලේ නගර සභාව | | | | |
| | දිනපතා වෙළදපලේ අංක 05 දරන ගව මස් කඩයේ ටෙන්ඩර්කරු ගිවිසුම් කොන්දේසි කඩ කිරීම හේතුවෙන් ව්‍යාපාරික කටයුතු අත්හිටුවා තිබුණි. ටෙන්ඩර්කරු ගෙවා තිබුණු තැන්පතු මුදලින් සභා අරමුදලට බැර කළ යුතු රු.648,340 ක් ආපසු ටෙන්ඩර්කරුට ගෙවීමෙන් මූල්‍ය අලාභයක් සිදුවී තිබුණි. | සභාවට අලාභයක් නොවන පරිදි කටයුතු කළ යුතුවේ. | මෙම ප්‍රසම්පාදනය සිදුකිරීමේදී අනුගමනය කළ යුතු සියළුම ක්‍රියාමාර්ගයන් අනුගමනය කර ඇති අතර, නගර සභාවට පාලනය කළ නොහැකි තත්ත්වයන් මත වර්ෂයට අදාලව ඉපයිය යුතු මුදල් උත්පාදනය කිරීමට නොහැකි විය. | පළාත් පාලන කොමසාරිස්ගේ හා විෂය භාර අමාත්‍යවරයාගේ උපදෙස් පරිදි කටයුතු කිරීමට නියමිතයි. |
| | | | | |

| | | | | |
|---|---|---|---|---|
| **08.** වැලිගම නගර සභාව | | | | |
| (අ) | ආයතන සංග්‍රහයේ XIX පරිච්ඡේදයේ 5.8 වගන්තිය ප්‍රකාරව ජලය හා විදුලිය පදිංචි තැනැත්තන් විසින් ගෙවිය යුතු වුවද සේවක පදිංචි නිවාසයක් වෙනුවෙන් 2015 අගෝස්තු 01 දින සිට 2020 දෙසැම්බර් 31 දක්වා රු.203,293 ක ජල හා විදුලි ගාස්තු සඳහා සභා අරමුදලින් ගෙවා තිබුණි. | ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුව කටයුතු කළ යුතු වේ. | නිල නිවාස සඳහා වෙනම විදුලි මනු හා ජල මීටර් සවි කිරීමට කටයුතු කරන බව. | අය කිරීමට කටයුතු කර නොමැත. |
| (ආ) | නගර සභාව සතු සුපිරි වෙළඳ සංකීර්ණයෙහි කඩ කාමර 02 කින් හා බස් නැවතුම්පොළ කඩ කාමර 04 කින් එක්වන් මුදල් රු. 1,570,601 ක් 2007 වසරේ සිට හිඟව පැවතුණි. | හිඟ මුදල් කඩිනමින් අයකළ යුතු වේ. | බදුකරුවන් දැනුවත් කර ඇති බව. | හිඟ මුදල් මේ දක්වා අය කර නොමැත. |
| **09.** හික්කඩුව නගර සභාව | | | | |
| (අ) | 2005 වර්ෂයේ දී රුපියල් ලක්ෂ 300 ක වියදමින් ඉදිකරන ලද පොදු වෙළඳපොල ගොඩනැගිල්ලේ උඩුමහලේ කඩ කාමර 17 ක් නිෂ්ක්‍රීයව පැවතුණි. | ගොඩනැගිල්ලේ කඩ කාමර කුලියට දීමෙන් ආදායම් ලබා ගැනීමට කටයුතු කළ යුතුවේ. | සභා රැස්වීමේ දී මේ පිළිබඳ තීරණයක් ගැනීමට යෝජනා කළ බව දන්වමි. | ඉහල මහලේ පවතින අඩුපාඩු මත කඩ කාමර ලබා ගැනීමට කිසිවෙකු ඉදිරිපත් නොවන අතර, එම මහල නැවත සකස් කිරීමට ඉංජිනේරු ඇස්තමේන්තුවක් දැනට සකස් කරමින් පවතියි. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | සංචාරක මණ්ඩලයේ අනුමත ආයතනවලින් සියයට 1 බදු අය කිරීමේ දී විගණන වාර්තා මත තහවුරු වූ මූල්‍ය ප්‍රකාශන ලබා නොගෙන එක් එක් ආයතනය විසින් පිළියෙල කර දී තිබූ ආදායම් වාර්තා පදනම් කරගෙන බදු අයකර තිබුණි. විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන ලබාගත හැකි වූ හෝටලයකින් පමණක් මුළු ආදායම මත බදු අය කිරීමේ දී තවදුරටත් රු.16,264,589 ක මුදලක් 2016 වර්ෂය හා 2017 වර්ෂය වෙනුවෙන් අයවිය යුතුව පැවතුණි. | විගණන වාර්තා මත ආදායම තහවුරු කරගෙන බදු අය කළ යුතු වේ. | 2019 වසරේ සිට විගණන වාර්තා මත බදු අයකරන බව හා මෙම ආයතනයට විරුද්ධව ඉදිරියේ දී නඩු තීන්දු මත කටයුතු කරමි. | නීති මඟින් හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කරනු ඇත. |
| **10.** | **තංගල්ල නගර සභාව** | | | |
| | පළාත් පාලන කොමසාරිස්ගේ (දකුණු) 2010 දෙසැම්බර් 27 දිනැති අංක දපපා/පපාකෙ/2010/01 දරන චක්‍රලේඛයේ 05 ඡේදය ප්‍රකාරව සභාව සතු කඩ කාමර 86 ක ගිවිසුම් යාවත්කාලීන කර නොතිබූ අතර යාවත්කාලීන නොකල කාල පරාසය මාස 02 ත් අවුරුදු 37 ත් අතර විය. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළයුතු වේ. | කඩ කාමර 86 න් 70 ක් සම්බන්ධව තංගල්ල පළාත් බද මහාධිකරණයේ නඩුවක් විභාග වෙමින් පවතින අතර, තීන්දුව ලැබුණු පසු ගිවිසුම් යාවත්කාලීන කිරීමට කටයුතු කරන බවත්, | ගිවිසුම් යාවත්කාලීන කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | | | ඉතිරි කඩ කාමර 16 හි පවතින ගැටළු නිසා ගිවිසුම්ගත නොවූ බව දන්වමි. | |
| 11. ඇඹිලිපිටිය නගර සභාව | | | | |
| (අ) | 1987 සැප්තැම්බර් 30 දිනැති නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් චක්‍රලේඛ අංක 08 හි 02 ඡේදය අනුව නාගරික සංවර්ධන බැංකු ගිණුමේ තැන්පත් කරන මුදල් වියදම් කිරීම නාගරික සංවර්ධන අධිකාරියේ පූර්ව අනුමැතියකින් තොරව සිදුනොකල යුතු වුවද, සභාව විසින් 2020 වර්ෂය තුල නාගරික සංවර්ධන අධිකාරියේ අනුමැතියකින් තොරව රු.5,000,000 ක් එම ගිණුමෙන් මහා සභාවේ අනුමැතිය මත පොදු ගිණුමට මාරු කර තිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. | විගණන නිරීක්ෂණය හා එකඟ වන බවත්, ඉදිරියේදී මෙම මුදල නාගරික සංවර්ධන අරමුදලට බැර කිරීමට කටයුතු කරන බව. | ඉදිරියේදී මෙම මුදල නාගරික සංවර්ධන අරමුදලට බැර කරන බව. |
| (ආ) | 2020 වර්ෂය අවසාන දිනට බදුකරුවන් 93 ක ගෙන් වර්ෂ 05 කට අධික කාලයක සිට හිඟව පවත්නා එකතුව රු. 7,373,104 ක් වූ පොදු වෙළඳපල කඩකුළී, බස්නැවතුම්පල කුළී සහ වෙළඳ ස්ථාන කුළී අයකර ගැනීමට සභාව අපොහොසත්ව තිබූ අතර, කඩකාමර 40 කට අදාළව | සභාවට අයවිය යුතු ආදායම් අප්‍රමාදව රැස්කර ගැනීමට කටයුතු කළ යුතුය. | කොරෝනා වසංගතය හේතුවෙන් මේ සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගැනීමට නොහැකි වූ අතර ඉදිරියේදී මෙම හිඟ | ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරන බව. |

| | | | | |
|---|---|---|---|---|
| | සමාලෝචිත වර්ෂය වෙනුවෙන් බදු ගිවිසුම්වලට එළඹ නොතිබුණි. තවද, කඩකාමර 04 කට අදාළව රු.1,023,231 ක් අයකර ගැනීම සඳහා බදුකරුවන්ට එරෙහිව නඩු පවරා තිබුණද, සෙසු කඩකාමරවල හිඟ කුළී අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි. | | කඩකුලී අයකර ගැනීමට කටයුතු කරන බව. | |
| (ඈ) | ආදායම් උත්පාදනය ප්‍රවර්ධනය කිරීමේ අරමුණ පදනම් කරගෙන පළාත් සභා ප්‍රතිපාදන මත රු. 2,689,200 ක් වැයකර ඩිජිටල් දැන්වීම් පුවරුවක් මිලදී ගෙන තිබුණ ද 2020 වර්ෂය තුල උපයා තිබූ ආදායම රු.35,500 ක් වීමෙන් ව්‍යාපෘති යෝජනාවට අනුව මූලික පිරිවැය මාස 20 කින් ආවරණය කර ගැනිමේ අරමුණ ඉටුකර ගැනීමට සභාව අපොහොසත් වී තිබුණි. | ව්‍යාපෘති යෝජනාව අනුව වත්කමින් අපේක්ෂිත ආදායම් ලබා ගැනීම සඳහා කටයුතු කළ යුතුය. | විවෘත තරඟකාරී ලංසු කැඳවීමේ ක්‍රමය යටතේ සුදුසු කොන්ත්‍රාත්කරුවෙකු තෝරාගත් බව හා ආදායම නොලැබීම හේතුවෙන් නැවත ප්‍රසම්පාදනය කර සැපයුම්කරුවෙකු තෝරා ගැනීමට යෝජනාවක් 2021 මැයි 28 දින පැවති මහා සභාවට යොමු කරන ලද නමුත් | ටෙන්ඩර් කර සැපයුම්කරුවෙකු තෝරා ගැනීමට කටයුතු කරන බව. |

| | | | | |
|---|---|---|---|---|
| | | | එම යෝජනාව ද ප්‍රතික්ෂේප වූ බව. | |
| (ඇ) | නාගරික සංවර්ධන අධිකාරිය විසින් කඩකාමර 64 ක් සහිතව 2014 වර්ෂයේ නගර සභාව වෙත පවරා දී තිබූ නවනගරය පොදු වෙළඳපොළ ලිඛිත ගිවිසුමකට එළඹීමෙන් තොරව කුළී පදනම මත බදුකරුවන් වෙත ලබාදී තිබුණි. ඒ සඳහා හිඟ කුළී රු.734,622 ක් කපාහැරීම සඳහා 2020 පෙබරවාරි මස ආණ්ඩුකාරවර අනුමැතිය ඉල්ලා තිබූ අතර, තවදුරටත් රැඳී සිටින බදුකරුවන් 09 දෙනෙකුගෙන් අයවිය යුතු රු.675,600 ක් අයකර ගැනීම සඳහා ලද උපදෙස් අනුව හිඟ මුදල් අයකර ගැනීමට සභාව කටයුතු කර නොතිබුණි. | ගිවිසුම්ගත නොවූ කඩකාමර සඳහා ගිවිසුම්ගතවීමට කටයුතු කළ යුතුය. හිඟ ආදායම් අප්‍රමාදව අයකර ගතයුතුය. | මුද්‍රා තබන ලද කඩ කාමර 11ක් නැවත ටෙන්ඩර් කර ගිවිසුම්ගත වූ බවත්, ගිවිසුම්ගත නොවූ කඩකාමර හිමියන් සමඟ ගිවිසුම් ගතවීමට කටයුතු කරන බව. කුළී නොගෙවූ කඩහිමියන්ට විරුද්ධව නීත්‍යානුකූල ක්‍රියාමාර්ග ගන්නා බව. | ඉදිරියේදී නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බව. |
| 12. කෑගල්ල නගර සභාව | | | | |
| (අ) | වර්ෂයකට වඩා වැඩි කාලයක සිට හිඟ හිට ඇති එකතුව රු.1,276,392 ක් වූ කුළී හා ගාස්තු 2020 වර්ෂය අවසන් වනවිටත් අයකරගෙන නොතිබුණි. | හිඟ ශේෂයන් අයකර ගැනීමට කටයුතු කල යුතුයි. | හිඟ මුදල් අයකර ගැනීම සඳහා කටයුතු කරමින් පවතින බවත්, අයකර ගත නොහැකි ගාස්තු පොත්වලින් කපා හැරීමේ | හිඟ ආදායම් අය වී නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | | | නියෝග ලබා ගැනීමට ඉල්ලීම් ඉදිරිපත් කර හා නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇති බවත්, දන්වා තිබුණි. | |
| (ආ) | 2020 වර්ෂය අවසානයට වර්ෂයකට වඩා වැඩි කාලයක් හිඟහිට තිබූ වරිපනම් බදු ශේෂය රු.1,293,086ක් විය. එම හිඟ ශේෂය අයකර ගැනීම සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | නගර සභා ආඥා පනතේ 170 වගන්තිය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | කොවිඩ් වසංගතය හේතුවෙන් දේපල තහනමට ගැනීමේ කටයුතු සිදු නොකළ බවත්, වර්ෂයකට වැඩි කාලයක් හිඟහිට ඇති වරිපනම් බදු වලින් වැඩි කොටසක් හිමිකම් නොකියන දේපල බැවින් වරිපනම් බදු අයකර ගැනීමට නොහැකි නිසා දේපල තහනමට ගැනීමේ කටයුතු ද සිදුකල නොහැකි බවත් දන්වා තිබුණි. | හිඟ වරිපනම් බදු අයවී නොතිබුණි. |

| 13. ජාඇල නගර සභාව | | | | |
|---|---|---|---|---|
| (අ) | කොට්ඨාශ අංක 05 හි අනවසර කඩ 23 ක් ඉදිකිරීම සිදුකර තිබුණද නගර සභා ආඥා පනතේ 77 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව ඒවා කඩා දැමීමට හෝ ඉවත් කරවීමට කටයුතු නොකොට වරිපනම් අංක ලබාදී නිත්‍යානුකූල තත්ත්වයට පත් කර තිබුණි. | අනවසර ඉදිකිරීම් සම්බන්ධව නගර සභා ආඥා පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. | එම කඩ ඉවත් කිරීම සම්බන්ධව නාගරික සංවර්ධන අධිකාරිය මගින් අධිකරණයේ නඩුවක් දැනටමත් පවරා ඇති අතර අධිකරණ නියෝගය ලද පසු මෙම කඩ ඉවත් කිරීම සිදු කරන බව දන්වා ඇත. | නැවත සාකච්ඡා කිරීම සඳහා මාර්ග සංවර්ධන අධිකාරිය සහ නාගරික සංවර්ධන අධිකාරිය කැඳවීමට ජා-ඇල නගර සභාව කටයුතු කර ඇති බව දන්වා ඇත. |
| (ආ) | 2018 දෙසැම්බර් 18 දින පවත්වා තිබූ ගිණුම් කාරක සභාව විසින් නගර සභාවට ලබාදුන් නියෝග ප්‍රකාරව 2016 වර්ෂයේ රු.1,130,435 ක් වැය කර සෙක්කුවත්ත ක්‍රීඩා පිටියේ ඉදිකර තිබූ පැසි පන්දු ක්‍රීඩා පිටිය පරිහරණය කලහැකි තත්ත්වයකට පත් කර ගැනීමට මෙතෙක් කටයුතු කර නොතිබුණි. | ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී අදාල ප්‍රමිතීන්ට අනුකූලව නිම කළ යුතු අතර ගිණුම් කාරක සභා නියෝග නිසි පරිදි ක්‍රියාත්මක කරමින් අදාල වත්කම් පරිහරණය කළ හැකි තත්ත්වයට | මෙම පැසිපන්දු ක්‍රිඩා පිටිය ක්‍රිඩාවට සුදුසු පරිදි අලුත්වැඩියා කර දෙන ලෙස නැවත පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරිය වෙත ලිඛිතව දැනුම් දෙන ලද බව දන්වා ඇත. | පළාත් ගිණුම් කාරක සභාව විසින් නගර සභාවට ලබාදුන් නියෝග ක්‍රියාත්මක කර නැත. |

| | | | | |
|---|---|---|---|---|
| | | පත්කිරීමට සභාව කටයුතු කළ යුතුවේ. | | |
| (ඇ) | බස්නාහිර පළාත්,පළාත් පාලන කොමසාරිස්ගේ 2016 දින රහිත GD/13/2016 චක්‍රලේඛය අනුව, වත්කම් අතුරු බදු දීමේදී මාසික බදු කුලිය මෙන් 60 ගුණයකට නොඅඩු වටිනාකමක් අයකළ යුතු වූවද සභාවට අයත් කඩ කාමර 35 ක් අතුරු බදුදීම සඳහා කැමැත්ත ප්‍රකාශ කර තිබියදී හා ඒ සඳහා අවශ්‍ය වන ප්‍රධාන අමාත්‍යවරයාගේ අනුමැතිය ලැබී තිබියදී අතුරු බදුදීමේ ක්‍රමවේදය 2020 සැප්තැම්බර් 22 වන විටත් ක්‍රියාත්මක කර නොතිබුණි.ඒ හේතුවෙන් සභාවට අහිමිවූ ආදායම රු.1,470,576 ක් විය.මෙම ආදායම් අහිමිවීම පැරණි කඩ කුලිය මත ගණනය කරන ලද අතර නව තක්සේරුව 2018 මැයි 25 දින ලැබී තිබුණද 2020 සැප්තැම්බර් 22 දින වන විටත් ක්‍රියාත්මක කර නොතිබුණි. | නව තක්සේරුව අනුව අනුමත පරිදි පැවරීම් කළ යුතුවේ. | නව තක්සේරුව අනුව අනුමත පරිදි පැවරීම් කරමින් පවතී. | නැවත සංශෝධනයක් 2021 නොවැම්බර් 29 දිනැතිව ලැබී ඇති අතර එම තක්සේරුව ක්‍රියාත්මක කිරීමට 2022 ජනවාරි 13 දින මාසික මහ සභාවේ අනුමැතිය ලබා ගෙන ඇති අතර මේ වන විට නව සංශෝධිත තක්සේරුව මත පැවරුම් ගාස්තු ගෙවා ගිවිසුම් ගත වන ලෙස දන්වා යවා අතුරු බදු පැවරීමේ කටයුතු සිදු කරමින් පවතී. |
| (ඈ) | පොඩි ඇල මාර්ගයේ පැති බැම්ම ඉදිකිරීම සඳහා අදියර 06 ක් යටතේ සමිති දෙකක් වෙත කොන්ත්‍රාත්තුව පිරිනමා තිබූ | නිවැරදි මිණුම් ලබාගෙන ගෙවීම් කළ යුතු අතර රජයේ | මිණුම් ලබා ගෙන ගෙවීම් කිරීම දැන් සිදු කරනු ලැබේ. | වැඩිපුර ගෙවීම අය කිරීමට කටයුතු කර නැත. |

| | | | | |
|---|---|---|---|---|
| | අතර මෙම පැති බැම්ම අඩි 853 ක් දිගින් යුතුව පොළව මට්ටමින් ඉහලට අඩි 2 ක් හා අඩි 7 අහල් 6 ක් පොළව යටට ඉදිකිරීම් සිදු කර තිබූ බව දක්වා රු.14,156,879 ක් ගෙවීම් කර තිබුණි. පොළව යටවූ කොටස සැලැස්ම ප්‍රකාරව පියවර 4 කින් යුතුවූ අතර පැති බැම්මේ පියවර 3 ක් 2021 ජනවාරි 19 දින භෞතිකව කැණීම් සිදු කරන ලදී. ඒ අනුව කොන්ක්‍රීට්වලින් නිම කර තිබූ 1, 2, 3 පියවරයන්වල අවසන් ගෙවීම් වාර්තා හා භෞතික පරීක්ෂාවේදී අනාවරණය වූ ප්‍රමාණයන් අතර වෙනස කියුබ් 95.18 ක් වූ අතර ඒ අනුව කොන්ක්‍රීට් සඳහා වැඩිපුර ගෙවූ මුදල රු.4,102,304 ක් විය. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධි විධානවලට අනුව කටයුතු කළ යුතුවේ. | | |
| 14. **කටුනායක සීදූව නගර සභාව** | | | | |
| (අ) | 2018 වර්ෂය වෙනුවෙන් හඳුනාගෙන තිබූ සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි ප්‍රධාන හෝටල් 03 කින් ආදායම මත සියයට 1 ක බලපත්‍ර ගාස්තුව අය කර නොතිබූ අතර ඒ අනුව අයවිය යුතු හිඟ ශේෂය රු.18,083,263 ක් විය. | නගර සභා ආඥා පනත අනුව ලියාපදිංචි සංචාරක හෝටල්වලින් ආදායම මත සියයට 01 ක බලපත්‍ර ගාස්තුවක් අයකර ගත යුතුය. | ලියාපදිංචි හෝටල් හිමියන් විසින් මහාධිකරණයේ පවරා ඇති නඩුවේ තීන්දුව ලැබෙන තුරු මෙම බලපත්‍ර ගාස්තු ගෙවිය නොහැකි බව දන්වන ලදි. | 2019 මැයි 27 දිනැති සභා තීරණය මත කාමර පදනම මත අයකර ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | කොන්ඩ්‍රඩ් ප්‍රේමතිරත්න මාවතේ වරිපනම් අංක 17 දරන දේපල සඳහා වාර්ෂික වටිනාකම රු 6,456,868ක් ලෙස තක්සේරු කර තිබූ අතර ඒ අනුව අය කළ යුතු වරිපනම් මුදල රු 193,796 ක් වී තිබුණි .එම වරිපනම් මුදල සඳහා විරෝධතා මතුවීම හේතුවෙන් 2014ඔක්තෝම්බර් 13දින සභාවේ ලේකම් විසින් එම තක්සේරුව රු. 5,580,865 ක් ලෙස සංශෝධනය කර තිබුණි .වරිපනම් හිමිකරු විසින් ගාස්තු වැඩි කිරීමට විරුද්ධව නීතිමය ක්‍රියාමාර්ග ගෙන තිබූ අතර සභා බලධාරින් නඩුවට ඉදිරිපත් නොවීම හේතුවෙන් උසාවිය විසින් 2014සහ 2015 වර්ෂ සඳහා නව තක්සේරුවක් නිකුත් කිරීමටත් හා එහි ප්‍රථිපලයක් ලෙස බදු ගාස්තු ඉහළ දැමීමට ගත් තීරණ අවලංගු කිරීමට තීරණය කර තිබුණි.ඉහත දේපලට අදාල රු.2,991,750 ක හිඟ වරිපනම් ආදායම් ශේෂයක් ආදායමින් ඉවත් කිරීමට කටයුතු කිරීමට සිදුව තිබූ අතර නීති ගාස්තු ඇතුළුව රු.3,015,750 ක මුදලක් සභාවට අහිමි වී තිබුණි. | නීතිමය කටයුතුවලදී සභාව විසින් ශක්තිමත් සාක්ෂි ඉදිරිපත් කරමින් නඩු කටයුතුවලට නිසි ලෙස පෙනී සිටීම සභාව සතු වගකීමකි. | නඩු තීන්දුව අනුව වැඩිපුර බිල්වී තිබූ මුදල කපා හැර ඇත. | අභියාචනාධිකරණ නඩු තීන්දුව අනුව වැඩිපුර බිල්වී තිබූ මුදල කපා හැර ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | සභාවට අයත් සීදූව විලේජ් පොදු ඉඩමේ බාහිර පුද්ගලයෙකුට ව්‍යාපාර කටයුත්තක් සඳහා තාවකාලික ගොඩනැගිල්ලක් ඉදිකිරිමට 2017 වර්ෂයේ ඉඩදී පසුව එය නවතා දැමීමට නියෝග කිරීම හේතුවෙන් අදාල බාහිර පාර්ශවකරු විසින් තමන් විසින් දරන ලද වියදම් හා තමාට සිදුවූ පාඩුවේ මුළු වටිනාකම වන රු.15,000,000 ක් අයකර දෙන ලෙස ඉල්ලමින් මීගමුව දිසා අධිකරණයේ සභාවට එරෙහිව නඩු පවරා තිබුණි. 2020 දෙසැම්බර් 17 දින වන විට නඩු වාර 09 ක් කැඳවා තිබූ අතර නඩුවට පෙනී සිටිම සඳහා සභාව විසින් නීතිඥවරයාට ගෙවා ඇති රු.490,000 ක නීතිඥ ගාස්තු වගකීම් විරහිතව බාහිර පුද්ගලයන්ට සභාව සතු ඉඩමේ ව්‍යාපාර කටයුතු සඳහා ගොඩනැගිලි ඉදිකිරීමට අවසර දුන් නිලධාරියාගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.අදාල නඩුව සඳහා පෙනී සිටින නීතිඥවරයා සමඟ සභාව ගිවිසුමකට එළඹ නොතිබූ අතර 2018 අගෝස්තු 17 දිනැති ලේකම්ගේ ලිපිය පරිදි එක් නඩු වාරයකදි ගෙවිය යුතු නීතිඥ | නීතිඥවරයා සමඟ සභාව ගිවිසුමකට එළඹීමට කටයුතු කළ යුතු අතර නීතිඥ ගාස්තු ගොඩනැගිලි ඉදිකිරීමට අවසර දුන් නිලධාරියාගෙන් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | අදාළ නඩුව සඳහා නීතිඥවරයා පත්කර ගැනීම සහ ගාස්තු සම්බන්ධයෙන් ගිවිසුමකට එළඹ නොමැති අතර වරින් වර ඔහු විසින් ලබා දෙනු ලැබූ ඉල්ලීම් වලට අදාළව මුදල් ගෙවීම් කර ඇති බව දන්වමි. | 2021 මාර්තු 22 දින මහා සභාවේදී මෙම නඩුවට අදාල වියදම් හා අලාභය මෙම කටයුත්තට මුල්වූ පුද්ගලයන්ගෙන් අය කර ගැනීමට තීරණය කර ඇති බව දන්වා ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| | ගාස්තුව රු.35,000 ක් ලෙස එකඟවී තිබුණු නමුත් එම මුදල ඉක්මවා විවිධ වටිනාකම්වලින් නීතිඥ ගාස්තු ගෙවා තිබීම හේතුවෙන් නඩු වාර 09 කදී රු.175,000 ක් වැඩිපුර ගෙවා තිබුණි. | | | |
| (ඇ) | සභාව විසින් වසර 20 ක පමණ කාලයක සිට කසළ බැහැර කිරීම සඳහා ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් අම්බලම්මුල්ල පිලපිටිය නමැති කුඹුරු ඉඩම භාවිතා කර තිබූ අතර ඒ සඳහා පස් යොදා D5D යන්ත්‍ර මඟින් කසළ තුනී කිරීමට වාර්ෂිකව රු. ලක්ෂ 60 ක පමණ මුදලක් වැය කර තිබුණි. මෙම ඉඩම රජයේ තක්සේරුවක් මත විකිණීමට ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව විසින් 2011 වර්ෂයේදී ලිඛිත කැමැත්ත දන්වා තිබියදී හා ඒ සඳහා රජය මඟින්ද ප්‍රතිපාදන වෙන්ව තිබියදී සභාවේ එකඟතාවයන් ලබා ගැනීමේ ප්‍රමාදයන් මත හා කළමනාකරණයේ නොසැලකිල්ල මත මෙම ඉඩමේ අයිතිය සභාව සතු කර ගැනීමට වසර 20 ක් යනතෙක් නොහැකිවී තිබුණි. කරුණු | සභාව වෙත කඩිනමින් පවරා ගැනීමට කටයුතු කළ යුතුවේ. | වර්තමානයේදී මෙම ඉඩම සභාව වෙත පවරා ගැනීමේ කටයුතු ආරම්භ කර ඇත. | වර්තමානයේදී මෙම ඉඩම සභාවේ එකඟතාවය මත සභාව වෙත පවරා ගැනීමේ කටයුතු ආරම්භකර ඇති බව දන්වමි. |

| | | | | |
|---|---|---|---|---|
| | මෙසේ තිබියදී ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව විසින් මෙම ඉඩම පවරා දුන් අයෙකුගේ දරුවෙකු වෙත පවරා දීමට 2020 ජනවාරි 27 දින කටයුතු කිරීමෙන් සභාවේ කසළ අපහරණය සම්බන්ධයෙන් ගැටළුකාරී තත්ත්වයක් උද්ගතවී තිබුණි. | | | |
| 15. **මිනුවන්ගොඩ නගර සභාව** | | | | |
| (අ) | හදිරම හන්දියේ වැසිකිළි පද්ධතිය රු.5,388,055 ක් වැය කර, 2018 ජනවාරි 04 වන දින ඉදිකිරීම් නිමකර තිබූ නමුත් 2019 මාර්තු 08දින වන විටත් මෙය භාවිතයට ගෙන නොතිබුණි. | අපේක්ෂිත අරමුණ ඉටු කර ගැනීම කෙරෙහි අවධානය යොමු කිරීම. | නව සභාව වැසිකිළි පද්ධතියද ඇතුලත් වන සේ නවීන සාප්පු සංකීර්ණයක් ඉදිකිරීමට යෝජනා වූවද එමගින් වියදම වැඩි වන බැවින් එම වැසිකිළිය ඉවත් කිරීමට ආණ්ඩුකාරතුමා ගේ අනුමැතියට ඉදිරිපත් කර ඇත. | 2021 මාර්තු 09 දින මහ සභාවේ තීරණය පරිදි වැසිකිළි පද්ධතිය ඉවත් කිරීමටත් ඒ සඳහා ආණ්ඩුකාරවරයා ගේ අනුමැතිය ලබාගැනීමටත් තීරණය විය.එම ලිපිය සම්බන්ධව මෙතෙක් අනුමැතියක් හෝ නිර්දේශයක් සභාව වෙත ලබාදී නොමැති බව දන්වමි. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | මීනුවන්ගොඩ නගර සංවර්ධනය යටතේ බස්නැවතුම්පළ, නව මාර්ගය හා සතිපොළ ඉදිකිරීමට සැලසුම් කර පෞද්ගලික ඉඩම් හිමියන් සතු බිම් කට්ටි 34 ක් ප්‍රාදේශීය ලේකම් විසින් රජයට පවරා ගෙන නගර සභාව වෙත පවරාදී තිබුණි. පවරා ගැනීමේදී ඉඩම් කට්ටි 03 ක් ගැසට් කිරීමට මඟ හැරී තිබුණු අතර, එහි එක් අයිතිකරුවෙකුගේ ඉල්ලීම පරිදි සංවර්ධනය කරන ලද ඉඩම් කට්ටියක් ආපසු භාරදීමට සිදුවී තිබුණි. නගර සභාව විසින් අදාල ඔප්පු පරිදි ඉඩම් මිනුම් කර ලබා ගෙන නොතිබු අතර, වසර 17 ක් ගතවී තිබුණද ස්ථිර ස්ථාන ලබාදෙන තෙක් විකල්ප ස්ථාන ලබාදී තිබූ ඉඩම් හිමියන් 08 දෙනෙකු සඳහා 2018 ඔක්තෝබර් 05 විගණන දිනටත් ස්ථිර ස්ථාන ලබාදී නොතිබුණි. තවත් ඉඩම් හිමියන් 08 දෙනෙකු විසින් වන්දි සම්බන්ධයෙන් නඩු පවරා තිබියදී එකී ඉඩම්වලින් එක් ඉඩම් හිමියෙකුට අදාල බිම් කොටසක් සඳහා නඩු කටයුත්ත නොසලකා සභාව විසින් ස්ථිරව ඔප්පු ලබාදී තිබුණි. | ඉඩම් පවරා ගැනීමේදී ඔප්පු පරිදි ඉඩම් මිණුම් කර ලබා ගැනීමට කටයුතු කළ යුතු අතර අදාල ඉඩම් හිමියන්ට වන්දි ගෙවීමට හෝ වෙනත් ඉඩම් ලබාදීමට කටයුතු කළ යුතුය. | නීතිමය කටයුතු සිදුකර ඇත. | මෙය වැරදි සහගත ක්‍රියා බැවින් අදාළ ඉඩම් කොටස් රජයේ ඉඩම් සන්තකය නැවත ලබා ගැනීමේ 1979 අංක 07 දරන පනත අනුව ඉදිරි කටයුතු මේ වන විට සිදුකරමින් ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | මිනුවන්ගොඩ නගරයේ 2019 මැයි 13 දින සිදුවූ කළහකාරි තත්ත්වය මත මධ්‍යම පොදු වෙළඳ සංකීර්ණයේ කඩ 32 කට අලාභ හානි සිදුවූ අවස්ථාවේදි වූ ගිවිසුම්ගතව සිටි බදුකරුවන් 7 දෙනෙකු හා ගිවිසුම්ගත නොවූ අතුරු බදුකරුවන් 20 දෙනෙකු සඳහා බස් නැවතුම අසල තාවකාලික කඩ කාමර ලබාදීමේදී බස්නාහිර පළාත් පාලන කොමසාරිස්ගේ LGD/06/02/04 පොදු හා 2017 දෙසැම්බර් 06 දිනැති චක්‍රලේඛය පරිදි කටයුතු නොකර කඩ කුලී ලේඛනයේ දීර්ඝ කාලයක සිට පැවත එන මාසික කුලිය පදනම් කරගෙන ගණනය කිරීම් කර තිබූ බැවින් සභාවට රු.4,848,000 ක පාඩුවක් සිදු වී තිබුණි. | චක්‍රලේඛය අනුව කටයුතු කළයුතු වේ. | තක්සේරු වාර්තාව ලැබී ඇත්තේ 2019 දෙසැම්බර් 09 දිනය. එබැවින් පැවති කඩ කුලිය පදනම්ව මාස 60 කුලිය අයකර පැවරීම සිදු කර ඇත. | නව තක්සේරුව අනුව කුලිය අය කර නැත. |
| 16. | **වත්තල මාබෝල නගර සභාව** | | | |
| (අ) | සභාවට අයත් පර්චස් 79 ක ඉඩම විකිණීම හා සභාවට අයත් ඉඩම් ගොඩනැගිලි බදුදීම සම්බන්ධයෙන් 2019 නොවැම්බර් 07 වන දින පවත්වන ලද රාජ්‍ය ගිණුම් පිළිබඳ විශේෂ කාරක සභා රැස්වීමේ නියෝග ප්‍රකාරව | රාජ්‍ය ගිණුම් පිළිබඳ විශේෂ කාරක සභා රැස්වීමේ නියෝග ක්‍රියාත්මක කළ යුතුවේ. | ඒ සම්බන්ධයෙන් පළාත් පාලන අමාත්‍යාංශ ලේකම් දැනුවත් කරන ලද අතර,ඒ අනුව පළාත් පාලන ලේකම් ලිපි | ඉඩමක් බවට අදාල නිර්දේශය මෙතෙක් ලබාගෙන නැත. |

| | | | | |
|---|---|---|---|---|
| | ගම්පහ දිස්ත්‍රික් ගොවිජන සේවා කොමසාරිස් වෙතින් මෙම ඉඩම ගොඩ ඉඩමක් බවට අදාල නිර්දේශය මෙතෙක් ලබාගෙන නොතිබුණි. | | මගින් ද ගොවිජන සේවා කොමසාරිස් දැනුවත් කර ඇත. | |
| (ආ) | සභාව විසින් 1973 වර්ෂයේදී මිලදී ගෙන තිබූ අක්කර 09 පර්චස් 20 ක ඉඩම සම්බන්ධයෙන් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් 2019 නොවැම්බර් 07 දින ලබාදී තිබූ නියෝගය ප්‍රකාරව සර්වේයර් ජනරාල් විසින් 2020 ජනවාරි 13 දින ඉඩමේ වර්තමාන තත්ත්වය පෙන්වන අංක CL/SQB/2019/59දරන කැබලි 28 ක අනුරේඛනයක් ඉදිරිපත් කර තිබුණි.ඒ අනුව කැබලි 03 ක වැඩිපුර භුක්ති විඳින ප්‍රමාණය පර්චස් 24.33 ක් වූ අතර නගර සභා ගොඩනැගිල්ල අයත් ඉඩම් කොටසින් අඩුවෙන් භුක්ති විඳින ප්‍රමාණය පර්චස් 2.34 ක් විය.දීර්ඝකාලීනව බදු පදනම මත හෝ අයිතිය හුවමාරු කරන ලද ඉඩම් වශයෙන් හිමිකම් වාර්තාවල නොපෙන්වන එහෙත් වරිපනම් අංක සහිතව හිමිකම් කියන ප්‍රමාණයෙන් අක්කර 01, රූඩ් 02, පර්චස් 39.13 ක් වූ | අයිතිය තහවුරු කර ගැනිමට කටයුතු කළ යුතුවේ. | නිවැරදි ක්‍රියාමාර්ග රැසක් ගෙන ඇති බව වාර්තා වේ. | දේපවලට අදාල ඔප්පු පිඹුරු පත් හිමිකම් වාර්තා සහ නගර සභා ඔප්පු පිඹුරු හිමිකම් වාර්තා නීතිඥවරයා වෙත යොමු කර අයිතිය තහවුරු කිරීමට කටයුතු කර ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| | කැබලි 12 ක් වූ අතර අනුරේඛනය පරිදි වරිපනම් ලේඛනවල ඇතුලත් නොවූ පර්චස් 01.43 ක් වූ කැබලි 03 ක් හා දැනට සොයා ගත නොහැකි පර්චස් 02.41 ක් වූ කැබලි 02 ක් විය.ඒ අනුව සභාව සතු ඉඩම් අනිසි පරිහරණය සඳහා ලබාදී තිබීම සම්බන්ධයෙන් ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි. | | | |
| (ඇ) | පෞද්ගලික සමාගමට බදුදී තිබූ ඉඩම 2020 සැප්තැම්බර් දින නිරීක්ෂණය කිරීමේදී එහි සභාව සතු ඉඩමක් බවට දැන්වීම් පුවරුවක් සවි කර තිබුණි.එම ඉඩම වටා තාප්පයක් ඉදි කර තිබුණද සමාගම විසින් ඉදි කර තිබූ ගොඩනැගිල්ල ඉවත් කර නොගැනීම නිසා තාප්පයේ ඉතිරි කොටස නිම කර නොතිබුණි. මේ වන විට අදාල සමාගම විසින් බදු අයිතිය අහෝසි කිරීම නිසා පාඩුවක් සිදුවූ බව සඳහන් කරමින් සභාවට, සභාපතිවරයාට හා ලේකම්වරයාට විරුද්ධව ලක්ෂ 500 ක වන්දියක් සමඟ වාර්ෂිකව සියයට 12 ක පොලියක් ඉල්ලා නඩු පවරන බව දක්වා එන්තරවාසියක් | නිරවුල් භුක්තිය ලබා ගැනීමට කටයුතු කළ යුතුවේ. | එහි ඉදිකර ඇති ගොඩනැගිල්ල ඉවත් කිරීම හා සවිකර ඇති යන්ත්‍ර සූත්‍ර ඉවත් කර සභාවේ නිරවුල් භුක්තිය ලබා ගැනීම සඳහා මීගමුව දිසා අධිකරණයේ නඩුවක් විභාග වෙමින් පවති. | මෙතෙක් නිරවුල් භුක්තිය ලබා ගෙන නැත. |

| | | | | |
|---|---|---|---|---|
| | එවා තිබූ අතර කෙසේ හෝ මෙම ඉඩම ඔවුන් සතු කර ගැනීමේ ප්‍රයත්නය ඉවත්වී නොමැති බව නිරීක්ෂණය විය. | | | |
| 17. **පානදුර නගර සභාව** | | | | |
| (අ) | 2010 වර්ෂයේදී අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරියේ සහ සහා අරමුදල් රු.774,593 ක් වැය කර ජීව වායු ඒකකයක් ඉදිකර තිබුණ ද එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොතිබුණි. | ඉදිකර ඇති ජීවවායු ඒකකය ඵලදායි ලෙස යොදවා ගැනීමට කටයුතු කල යුතුවේ. | ජීව වායු ඒකකය ක්‍රියාකාරි තත්වයට පත් කිරිමට රු.ලක්ෂ 10 ක වියදමක් යන අතර ඉන් අපේක්ෂිත ප්‍රතිලාභ ලබා ගැනිමට නොහැකි වේ. | ජීව වායු ඒකකයේ අක්‍රිය වී ඇති යන්ත්‍රය අළුත්වැඩියා කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ආ) | ගිණුම් කළමනාකරණ හා වැටුප් හා මානව සම්පත් කළමනාකරණ මෘදුකාංග පද්ධතිය ස්ථාපිත කිරිම සඳහා රු.720,000 ගෙවා තිබුණි. මෘදුකාංග පද්ධතිය ස්ථාපිත කළ දින සිට මේ දක්වා එය භාවිතා කළ නොහැකි තත්ත්වයක පවතින බවත්, ලෙජර් ගිණුම් ඇතුළු මූල්‍ය ප්‍රකාශන අතින් සකස් කරන බවත් එතෙක් පැවති රාජ්‍ය අංශ වැටුප් සකස් කිරිමේ මෘදුකාංගය භාවිතයෙන් වැටුප් සකස් කරමින් පවතින බව නිරීක්ෂණය විය. | මෘදුකාංග පද්ධතිය භාවිතයට ගැනීම සඳහා ක්‍රියා කල යුතුය. | වැටුප් හා මානව සම්පත් කළමනාකරණ මෘදුකාංගය ආයතනයට අනවශ්‍ය බවත් ඒ සඳහා ගෙවා ඇති මුදල් පිලිබඳ විධිමත් ක්‍රියා පිළිවෙලක් අනුගමනය කිරීම සඳහා ආයතනය දැනුවත් කර ඇති බව | පිළිතුර එසේම පවති. |

| | | | | |
|---|---|---|---|---|
| 18. **හොරණ නගර සභාව** | | | | |
| (අ) | 1994 වර්ෂයේදී සොරණවත්ත වෙන්දේසි ඉඩමෙන් පොදු පහසුකම් සඳහා සභාවට වෙන් කර ඇති රූඩ් 02 පර්චස් 06 ක ඉඩමෙන් යාබද ඉඩම්හිමියා විසින් අනවසරයෙන් අල්ලාගෙන තිබූ ඉඩම් කොටස ආපසු ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | අනවසරයෙන් භුක්ති විඳින සභාවේ ඉඩම් කොටස සභාවට ලබාගත යුතුය. | සභා නීතිඥ මහතාගේ උපදෙස් පරිදි අනවසර පදිංචිකරු දැනුවත් කර ඇත. | අනවසර පදිංචි කරුවන් මේ වන විටත් ඉවත් කර නැත. |
| (ආ) | 2016 ජුනි 08 වන දින ආරම්භ කර තිබූ ගල්ඒදඩුගොඩ කාය වර්ධන මධ්‍යස්ථානය හා 2018 ඔක්තෝබර් 11 වනදින ආරම්භ කර තිබූ හොරණ නගර සභා කායවර්ධන මධ්‍යස්ථානය සඳහා පිළිවෙලින් රු.1,000,000 ක් හා රු.953,087 ක උපකරණ සභාව විසින් ලබාදී තිබුණ ද ඒ සඳහා විධිමත් පුහුණුකරුවෙකු පත්කර නොතිබුණි. | කායවර්ධන මධ්‍යස්ථාන සඳහා විධිමත් පුහුණුකරුවෙකු පත් කිරිමට කටයුතු කළ යුතුය. | කායවර්ධන මධ්‍යස්ථානයේ පුහුණුකරු තනතුරක් කාර්ය මණ්ඩලය තුළ නොමැති අතර දැනට සභා යෝජනාවට අනුව හැකියාව ඇති පුහුණුකරුවන් දෙදෙනෙකු යටතේ මෙය පවත්වාගෙන යන බව | මේ වන විට කායවර්ධන මධ්‍යස්ථාන ක්‍රියාත්මක තත්ත්වයේ නොතිබුණි. |
| (ඇ) | කැබ් රථයක එංජිමට 2020 අගෝස්තු මාසයේ යම් ද්‍රව්‍යයක් ඇතුල් කිරීමෙන් එන්ජිම ක්‍රියා විරහිත වී තිබුණු අතර ඒ සඳහා අවස්ථා කිහිපයකදී පරීක්ෂණ පවත්වා සිදු වූ හානිය හා ඒ | කැබ් රථයේ හානිය සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරින් හඳුනාගෙන | වගකිව යුතු නිලධාරින් හඳුනාගැනීමට විධිමත් පරික්ෂණයක් හා පොලිස් | පරීක්ෂණය අවසන් කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරින් හඳුනා ගැනීමට කටයුතු කළද, 2021 මාර්තු වන විටත් වගකිව යුතු පුද්ගලයින් නිශ්චය කර ගැනීමට සභාව අපොහොසත් වී තිබුණි. එසේම වගකිව යුතු අය නිශ්චය කිරිමකින් තොරව වාහනයේ එන්ජිම රු.1,485,515 ක ඇස්තමේන්තු පිරිවැයකට අළුත්වැඩියා කිරිම සඳහා යොමු කර තිබුණි. | අවශ්‍ය කටයුතු කඩිනමින් කිරීමට කටයුතු කළයුතුය. | පරීක්ෂණයක් සිදු කරමින් පවතින බව | |
| 19. කැස්බෑව නගර සභාව | | | | |
| | සභාවට අයත් බෝකුන්දර රජයේ නිවාස වල කුලී පදනම මත දීර්ඝ කාලයක සිට පදිංචිව සිටින කුලී නිවැසියන් 17 දෙනෙකුට ඉඩම් ඔප්පු ලබා දීම සම්බන්ධ යෝජනාව 2010 පෙබරවාරි 23 දින මහා සභාවේ ඒකමතිකව සහා සම්මත වී තිබුණි.2020 දෙසැම්බර් 31 දින වන විටත් ඉඩම් බෙදා දීම සම්බන්ධයෙන් පවතින සියළු ගැටළු නිරාකරණය කර ඔප්පු ලබා දී නොතිබුණි. | ගැටළු නිරාකරණය කර ඔප්පු ලබා දීමට කටයුතු කළ යුතුවේ. | ඔප්පු ලබාදිමේ කටයුතු සඳහා නිති උපදෙස් ලබා ගැනිමට නිතිඥ වෙත යොමුකර ඇත. නිශ්චිත දේපළ බැහැර කිරිමට ආණ්ඩුකාරවර යාගේ අනුමැතිය ලබා ගැනිම සඳහා පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතියට යොමුකර ඇත. | ඉදිරි කටයුතු සිදු වෙමින් පවති. |

| 20. සීතාවකපුර නගර සභාව | | | | |
|---|---|---|---|---|
| (අ) | නගර සභා බලප්‍රදේශය තුළ ජනනය වන ඝණ අපද්‍රව්‍ය සභාවට අයත් උක්වත්ත කසළ බැහැර කිරීමේ ආයතනය වෙත බැහැර කරනු ලබන අතර 2016 වර්ෂයේ සිට මෙම කසළ කන්ද ආසන්නයේ ආරක්ෂාවට ඉදිකර තිබූ පැති බැම්ම ස්ථාන තුනකින් පමණ පුපුරා තිබුණි. ඒ සම්බන්ධයෙන් ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ භූතාක්ෂණ ඉංජිනේරු අංශය විසින් කරන ලද පර්යේෂණයේදී එම කසළ රඳවනයේ ඇති පාෂාණ ස්ථර තල්ලුවීම වැනි හේතු මුල් කරගෙන ඉදිරියේදී සිදුවිය හැකි ජීවිත හා දේපළ හානි වළක්වා ගැනීම සඳහා අධි අවධානම් කලාපයේ ජීවත්වන පවුල් ඉවත්කළ යුතු බව නිර්දේශ කර තිබුණි. මේ හේතුවෙන් සභාව විසින් තාවකාලික විසඳුමක් වශයෙන් මෙම අධි අවදානම් කලාපයේ පදිංචි පවුල් 3 කට මසකට රු.15,000 බැගින් මාස 03 ක් සඳහා රු.90,000 ක මුදල් ලබා දී ඔවුන් එම ස්ථානයෙන් ඉවත් වන ලෙස දැනුම් දී තිබුණි. නමුත් එම පවුල් 2021 අප්‍රේල් | දැඩි අවදානම් පවුල් එම ස්ථානයෙන් ඉවත් කිරීමටත් නව කසළ අංගනය ස්ථාපිත කිරීමේ කටයුතු ද කඩිනමින් ඉටුකළ යුතුවේ. | උක්වත්ත කසල කන්ද ආශ්‍රිතව 2019 වර්ෂයේදී ඇති වූ ධාරානිපාත වර්ෂාව හේතුකොටගෙන සිදු වූ නායයෑමේ අවධානම පිළිබඳව ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය හා ජාතික ගොඩනැගිලි පර්යේෂණ මධ්‍යස්ථානය 2019.04.21 වන දිනැති ලිපිය මගින් අපවෙත දැනුම් දී තිබුණි.<br><br>ඒ අනුව, බස්නාහිර පළාත් අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය මගින් එවන ලද 2019.04.06 ලිපියට අනුව එහි අවධානම් | මෙම කසල අංගනයේ ස්ථායිතාවය ඇති කිරිම සඳහා ජාතික ගොඩනැගිලි හා පර්යේෂණ ආයතනය මගින් මූලික පර්යේෂණ කටයුතු අවසන් කොට ඇත.<br><br>එමෙන්ම මෙම කසල අංගනය වෙතට දෛනිකව කසල ඒකරාශි කිරීම මේ වන විට නවතා දමා ඇත. ඉදිරි කාලය තුළ මෙම ස්ථානය පුස්සැල්ලාව වැව්ලි සමාගමට අයත් ජනශූන්‍ය ප්‍රදේශයකට ගෙන යාමට කටයුතු සිදුකරමින් පවතී. |

| | | | | |
|---|---|---|---|---|
| | 05 දින වන විටද ඉවත් වී නොමැති අතර එම පවුල් නැවතත් කසළ කන්ද අවට පදිංචි වී සිටින බවට විගණන පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. 2018 මාර්තු 21 දිනැති අංක 18/0309/744/009 දරන අභියාචනා මණ්ඩල තීරණය පරිදි උක්වත්ත කසළ කන්දේ ඇති අවධානම ඉවත් කිරීම සඳහා නව කසළ අංගණයක් ස්ථාපිත කිරීමට පුස්සැල්ලැව වැවිලි සමාගමට අයත් වතු යායෙන් අක්කර 05ක බිම් කොටසක් අත්පත් කර ගැනීමට යෝජනාකර ඇතත් ඊට අවශ්‍ය ක්‍රියාමාර්ග 2020 වර්ෂයේදීද සිදුකර නොතිබුණි. | | කලාපයේ පදිංචි පවුල් 03 ක් ප්‍රාදේශීය ලේකම් විසින් කරන ලද තක්සේරුව අනුව රු.15,000/- ක මුදලක් මසකට ලබාදී මාස 03 ක් සඳහා එම ස්ථානයෙන් ඉවත් කිරීමට පියවර ගන්නා ලදී.<br><br>තවද මෙම අවධානම් කලාපයේ ජීවත් වන පවුල්වල පදිංචිකරුවන් ගේ නිවාස සඳහා දේපල තක්සේරුව තක්සේරු දෙපාර්තමේන්තුව මගින් ලබා ගෙන ඇත. | |
| | | | | |

| | | | | |
|---|---|---|---|---|
| 21. | **කුලියාපිටිය නගර සභාව** | | | |
| | කුලියාපිටිය පොදු වෙළඳපල අංක 2 කඩ කාමරයේ බදුකරුගෙන් 2019 ඔක්තෝබර් මස සිට අයවිය යුතු රු.719,218 ක බදු මුදලක් 2020 වර්ෂය අවසාන වන විටද අයකර ගැනීමට නොහැකිවී තිබුණි. | හිඟ ශේෂය අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | හිඟ මුදල් අයකර ගැනීම සඳහා නීතිමය කටයුතු කරමින් පවතී. | හිඟ ශේෂය මෙතෙක් අයකර නැත. |
| 22. | **හලාවත නගර සභාව** | | | |
| (අ) | දිගුකාලීන කුලී පදනම මත ලබාදී තිබූ කඩ කාමර 27ක් වෙනුවෙන් 2020 වර්ෂයට අදාළව බිල්කළ වටිනාකමින් රු.4,473,215ක් හා 2020 වර්ෂයට අදාළව බදු දී තිබූ දේපල 15 කට අදාළව බිල් කළ වටිනාකමින් රු.3,427,199 ක් පළාත් පාලන කොමසාරිස්තුමාගේ හා විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතියකින් තොරව කපා හැර තිබුණි. | පළාත් පාලන කොමසාරිස්තුමා ගේ හා විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතියකින් කපාහැරීම් සිදුකල යුතුවේ. | පළාත් පාලන කොමසාරිස් තුමා වෙත ලිඛිතව දන්වා යවා ඇත. | 2022 ජනවාරි මස අවසන් වනවිටත් විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතියක් ලබාගෙන නොතිබුණි. |
| (ආ) | 2010 වර්ෂයේ සිට ඉදිරියට ගෙන එමින් පවතින රු.8,871,877ක් වූ පෙර ගෙවුම් ශේෂ වටිනාකම හා රු.73,940ක් වූ සභාව විසින් කළ තැන්පත් වටිනාකම නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියට ගෙන එමින් පවතින ශේෂ කඩිනමින් හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වේ. | නිරවුල් කිරීමට කටයුතු කරමින් පවතී. | 2022 ජනවාරි මස අවසන් වනවිටත් මෙම වටිනාකම් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. |
| | | | | |

| | | | | |
|---|---|---|---|---|
| 23. අම්පාර නගර සභාව | | | | |
| **(අ)** | පළාත් පාලන අමාත්‍යවරයාගේ අනුමැතියකින් තොරව ලැබිය යුතු කඩ කුලී රු.6,955,377 ක් කපා හැර තිබුණි. | පනත ප්‍රකාරව හිඟ ආදායම් කපා හැරීමට පළාත් පාලන අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගත යුතු වේ. | මෙම විස්තර පළාත් පාලන කොමසාරිස්ට දැනුම් දී ඉදිරි කටයුතු කිරීමට සැලසුම් කර ඇත. | පළාත් පාලන අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි. |
| **(ආ)** | 2020 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයකරගත යුතු හිඟහිටි කඩ කුලී රු.6,393,580 ක් අයකර ගෙන නොතිබුණි. | හිඟහිටි කඩ කුලී අයකර ගත යුතු වේ. | අදහස් දක්වා නොමැත. | හිඟහිටි කඩ කුලී අයකර ගෙන නොතිබුණි. |
| 24. වවුනියාව නගර සභාව | | | | |
| **(අ)** | කුලියට දුන් ඉඩම්වල හා කුටි 315ක ගිවිසුම්ගත කාලය අවසන් වී වසර 01 සිට 33 දක්වා කාලයක් ගතවී තිබුණ ද, නැවත ගිවිසුම්ගත වීමකින් තොරව භාවිතා කරමින් පැවතුණි. | නැවත ගිවිසුම්වලට එළැඹීමට පියවර ගත යුතුය. | ගිවිසුම්වලට ඇතුළත් නොවූ කුටිවලට දැන්වීම් නිකුත් කරමින් කොන්ත්‍රාත්තු අලුත් කිරීමට පියවර ගනිමින් සිටී. | මේ දක්වාම ගිවිසුම්වලට එළැඹ නොතිබුණි. |
| **(ආ)** | 2018 වර්ෂයේදී රු.2,534,837 කින් නිම කළ කුරුමන්කාඩු වැඩිහිටි උද්‍යානය නිශ්කාර්යව පැවතුණි. | එය භාවිතා කිරීමට පියවර ගත යුතුය. | කුරුමන්කාඩු වැඩිහිටි උද්‍යානයේ අත්‍යවශ්‍ය වැඩ කිහිපයක් සම්පූර්ණ කළ යුතු බැවින් ඒවා අවසන් වූ පසු උපරිම | මේ දක්වාම අභාවිතව පැවතුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | | | ප්‍රයෝජනට ගැනීමට කටයුතු කරනු ලැබේ. | |
| **(ඇ)** | පුස්තකාල ගොඩනැගිලි අරමුදලේ වූ රු.1,006,971ක් ඉකුත් වර්ෂ 05කට අධික කාලයක සිට අදාළ අරමුණු සඳහා උපයෝජනය නොකර ස්ථාවර තැන්පතු ගිණුම්වල රඳවා තිබුණි. | මේ සම්බන්ධයෙන් සාකච්ඡා කර සුදුසු පියවර ගැනීම. | ස්ථාවර තැන්පතු පොලී සභාවට ආදායමක් වන අතර එම තැන්පතු අවශ්‍යතාව අනුව භාවිතා කරනු ලැබේ | මෙම මුදල් තැන්පතු ලෙස පවතී. |
| 25. **කින්නියා නගර සභාව** | | | | |
| | 2006 සිට 2020 දක්වා හිඟ වරිපනම් එකතුව රු.1,927,679 ක් අයකර ගෙන නොතිබුණි. | හිඟ වරිපනම් බදු අයකර ගතයුතුය. | හිඟ වරිපනම් බදු අයකර ගැනීමට ඉදිරියේදී කටයුතු කරමි. | හිඟ වරිපනම් බදු අයකර ගෙන නොතිබුණි. |
| 26. **ත්‍රිකුණාමලය නගර සභාව** | | | | |
| (අ) | වර්ෂ 12 ක සිට පැවත එන රු.11,863,654 ක් වූ අවිනිශ්චිත ගිණුමේ ශේෂය 2020 දෙසැම්බර් 31 දින වන විටත් නිරවුල් කර නොතිබුණි. | අවිනිශ්චිත ගිණුම් නිරවුල් කළයුතු වේ. | අදාළ අඩුපාඩු දැනට නිවැරදි කිරීමට පියවර ගෙන ඇත. | අවිනිශ්චිත ගිණුම් නිරවුල් කර නොතිබුණි. |
| (ආ) | 2020 දෙසැම්බර් 31 දිනට පෙර වර්ෂයේ හිඟ වරිපනම් බදු රු.96,633,007 ක් අය කිරීම සඳහා ආදායම් රැස්කිරීමේ නිලධාරීන් පත්කර තිබුණත් ඔවුන් විසින් රු.741,135 ක් පමණක් අයකර ගෙන තිබුණි. | හිඟ මුදල අය කිරීමට කටයුතු කළයුතු වේ. | රැස් කිරීමේ නිලධාරීන්ට වර්ෂය තුළ රැස් කළයුතු හිඟ ප්‍රමාණය නිර්නය කර උපදෙස් ලිපි ලබාදීමට කටයුතු කර ඇත. | හිඟ මුදල් අයකර ගෙන නොතිබුණි. |
| | | | | |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | වර්ෂ 09 කට වඩා පැරණි රු.4,523,682 ක් වූ ටෙන්ඩර් තැන්පතු නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | නිරවුල් කිරීමට කටයුතු කළයුතුය. | නිරවුල් කිරීමට පියවර ගනිමි. | තැන්පතු නිරවුල් කර නොතිබුණි. |
| (ඈ) | රෝහල්වලින් බැහැර කරන අපද්‍රව්‍ය පිළිස්සීමේ යන්ත්‍රය ස්ථාපිත කිරීමේ කටයුතු රු.5,695,830 ක් වැය කර 2015 වර්ෂයේදී නිමකර තිබුණි. කෙසේ වෙතත්, මෙම පිළිස්සීමේ යන්ත්‍රය විගණිත දිනය වන 2020 මාර්තු 14 දින වන විටත් නිශ්කාර්යව පැවතුණි. | ශක්‍යතා අධ්‍යයනය සිදු කිරීමෙන් පසුව පමණක් මෙවැනි සැලසුම් ආරම්භ කිරීමට පියවර ගතයුතු වේ. | රෝහල් පරිශ්‍රයේ වෙනත් අපද්‍රව්‍ය පිළිස්සීමේ යන්ත්‍රයක් ස්ථාපිත කර තිබූ නිසා සභාව විසින් පොදු සුසාන භූමිය ආශ්‍රිතව ස්ථාපිත කළ යන්ත්‍රය භාර ගැනීමට හෝ භාවිතා කිරීමට රෝහල ඉදිරිපත් නොවීය. | වත්කම් භාවිතයට ගෙන නොතිබුණි. |
| (ඉ) | නගර සභා නිල නිවාසවල පදිංචි නිලධාරීන් 30 දෙනෙකුගෙන් වර්ෂ කිහිපයක සිට කුලී නොගෙවීම නිසා 2020 වර්ෂය අවසානය වනවිට රු.762,421 ක් හිඟ හිටිව තිබුණි. | හිඟ කුලී අය කිරීමට කටයුතු කළයුතුය. | දෙදෙනෙකුට නඩු පවරා ඇත. | කුලිය අයකරගෙන නොතිබුණි. |
| (ඊ) | සභාවේ ගණකාධිකාරී තනතුර වර්ෂ 12 කට අධික කාලයක සිට පුරප්පාඩු වී තිබුණු අතර සභාවේ ලේකම් තනතුර සඳහා ශ්‍රී ලංකා | ගණකාධිකාරිවර යෙකු හා ලේකම්වරයෙකු බඳවා ගැනීමට | පළාත් පාලන කොමසාරිස්ගෙන් ඉල්ලීම් කර ඇත. | පුරප්පාඩු සම්පූර්ණ කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | පරිපාලන සේවයේ නිලධාරියෙකු බඳවා ගැනීමට කටයුතු කර නොතිබුණි. | කටයුතු කළයුතු වේ. | | |
| (උ) | නගර සභා ආඥා පනතේ (255 අධිකාරය) 165 d උප වගන්තිය ප්‍රකාරව නගර සභා බල ප්‍රදේශයක පිහිටි කිසියම් ඉඩමක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමෙන් හෝ වෙනත් ආකාරයකින් හෝ වෙන්දේසි විකුණුම්කරු හෝ තැරැව්කරු හෝ ඔහුගේ සේවකයා හෝ නියෝජිතයා මගින් විකුණනු ලබන විට විකිණීම නැතහොත් ඔහුගේ සේවකයා නැතහොත් නියෝජිතයා එවැනි විකුණුම් මුදලෙන් 1% කට සමාන බද්දක් නගර සභාවට ගෙවිය යුතු වුවත්, 2018 වර්ෂයේ ඉඩම් විකිණීමෙන් ලැබිය යුතු 1% ක විකුණුම් බදු රු.5,653,900 ක් සහ 2019 වර්ෂය සඳහා ඉඩම් විකුණුම් බදු ගණනය කර අය කිරීමට කටයුතු කර නොතිබුණි. | ඉඩම් විකුණුම් බදු කාලීනව අය කළයුතුය. | මේ සම්බන්ධයෙන් සියළුම නීතිඥවරුන් වෙත ලිපි යවා ඇත. එසේම, ඉඩමේ අයිතිය මාරු කිරීමට ඉදිරිපත් කිරීමේදී මෙම බදු ගෙවන ලද ඉඩම් සඳහා පමණක් අයිතිය පැවරීමට තීරණය කර තිබුණි. | ඉඩම් විකුණුම් මත බදු අයකරගෙන නොතිබුණි. |
| **27.** | **එරාවූර් නගර සභාව** | | | |
| (අ) | පුස්තකාල ගොඩනැගිලි සංකීර්ණය සමඟ සංස්කෘතික මධ්‍යස්ථාන ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා 2016 වර්ෂයේ | සම්පූර්ණයෙන් නිම කිරීමට පියවර ගතයුතු වීම. | අවසන් කිරීමට ක්‍රියාමාර්ග ගෙන ඇත. | ඉදිකිරීම් අවසන්ව නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | රු.මිලියන 117 ක ඇස්තමේන්තුවක් සඳහා ගිවිසුම් ගත වී තිබුණත්, කාර්යයන් 2018 වර්ෂය තෙක් නිම වී නොතිබුණි. | | | |
| (ආ) | ඝන අපද්‍රව්‍ය මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම සඳහා UNOPS ආයතනය විසින් 2017 අප්‍රේල් මාසයේ ගිවිසුම්ගත වූ ආකාරයට එකතු කරනු ලැබූ නොදිරන කසල කොඩුවාමඩු Land fill මධ්‍යස්ථානයට ගෙනයනු ලබන බවත් දිරන කසළවලින් කාබනික පොහොර නිෂ්පාදනය කරනු ලබන බවත් එකඟ වූ නමුත් 2020 වර්ෂයේදී රු.1,906,683 ක වියදමක් දැරුවද ඇතැම් අපද්‍රව්‍ය ගංඉවුරේ බැහැර කරනු ලබන අතර කාබනික පොහොර නිෂ්පාදනයක්ද සිදු නොකරන ලදි. | සති අන්ත දිනවලද බැහැර කිරීම සඳහා විශේෂ වැඩපිළිවෙලවල් යෙදිය යුතු වීම. | වැඩපිළිවෙලවල් සිදුකර ඇත. | කසල බැහැර කිරීම සඳහා ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |
| **28.** | **කාත්තන්කුඩි නගර සභාව** | | | |
| | LGIP ණය වැඩසටහන යටතේ නගර සභා බල ප්‍රදේශයේ පවතින මාර්ග සහ කානු පද්ධති සංවර්ධනය කිරීමේ අරමුණින් සියයට 09 ක වාර්ෂික පොලියක් මත වර්ෂ 10 කින් ආපසු ගෙවීමේ පදනම මත රු.7,317,456 ක ණය 2018 | මාර්ග අළුත්වැඩියා කිරීම අවශ්‍ය වේ. | මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම සඳහා වහාම පියවර ගනු ලැබේ. | මාර්ග ප්‍රතිසංස්කරණය කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | වර්ෂයේදී ගෙන තිබුණි. නමුත් මෙම මාර්ග විධිමත් අයුරින් සම්පූර්ණ කර නඩත්තු නොකර පැවතුණි. | | | |
| **29.** වැල්වැටිතුරේ නගර සභාව | | | | |
| | ස්ථාවර තැන්පතු රු.67,340,802 ක් නගර සංවර්ධන අරමුණු සඳහා උපයෝජනය නොකර පොලී ආදායම් ඉපැයීමේ අරමුණින් බැංකුවේ තැන්පත් කර තිබුණි. | සභාවේ අරමුදල් සංවර්ධන කාර්යයන් සඳහා යෙදවිය යුතුය. | ඉදිරියේදී ඒවා උපයෝජනය කරනු ලැබේ. | මේ දක්වාම එම අරමුදල් සංවර්ධන ව්‍යාපෘති වෙනුවෙන් උපයේජනය කර නොතිබුණි. |
| 30. වාවකච්චේරි නගර සභාව | | | | |
| (අ) | රු..23,661,278 ක් වටිනා ස්ථාවර තැන්පතු, නගර සංවර්ධනය සඳහා යොදවා නොගෙන පොලී ඉපැයීමේ අරමුණින් බැංකුවේ තැන්පත් කර තිබුණි. | සභාවේ අරමුදල් උපරිම මට්ටමින් මෙහෙයුම්වල යෙදවීමට කටයුතු කළයුතු වේ. | මෙය ඉදිරියේදී නිවැරදි කරනු ලැබේ. | මේ දක්වාම එම අරමුදල් සංවර්ධන ව්‍යාපෘති වෙනුවෙන් උපයෝජනය කර නොතිබුණි. |
| (ආ) | කඩකාමර 41 ක කුලි ගිවිසුම් අලුත් කිරිම සඳහා ප්‍රමාද වී ඇති කාලය වර්ෂ 07 ත් වර්ෂ 40 ත් අතර පරාසයක විය. | කුලි ගිවිසුම්වල සඳහන් කාල පරිච්ඡේදයට අනුකූලව ගිවිසුම් අලුත් කිරීමට කටයුතු කළයුතු වේ. | වෙනත් පුද්ගලයින් විසින් කඩකාමර භාවිතා කරන බැවින් ගිවිසුම් අලුත් කළ නොහැකිව පවතී. | කුලි ගිවිසුම් අලුත් කිරීම සඳහා මේ දක්වාම පියවර ගෙන නොතිබුණි. |
| | | | | |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | කාබනික පොහොර නිෂ්පාදනයට සහ ඝන අපද්‍රව්‍ය වර්ගීකරණය සඳහා රු.4,690,000 කට ඉදි කළ ගොඩනැගිල්ල සහ මේ දක්වාම සවි කර නොමැති ඝන අපද්‍රව්‍ය ඇඹරුම් යන්ත්‍රය වර්ෂ 05 කට වැඩි කාලයක සිට අවභාවිතව පවතී. | සභාව සතු වත්කම් නිසි පරිදි උපයෝජනය කළයුතු වේ. | විදුලිබලය නොමැති නිසා ඇඹරුම් යන්ත්‍රය සවි නොකරන ලදී. වර්තමානයේ මෙම ගොඩනැගිල්ල අලුත්වැඩියා කර නැවතත් පොහොර නිෂ්පාදනය ක්‍රියාත්මක කෙරේ. | තවදුරටත් එම වත්කම් අභාවිතව පවතී. |
| **31.** | **ජේදුරුතුඩුව නගර සභාව** | | | |
| | ස්ථාවර තැන්පත් රු.210,987,678 ක් නගර සංවර්ධන අරමුණු සඳහා උපයෝජනය නොකර පොලී ආදායම් ඉපැයීමේ අරමුණින් බැංකුවේ තැන්පත් කර තිබුණි. | සභාවට අයත් අරමුදල් සංවර්ධන අවශ්‍යතා සඳහා උපයෝජනය කළයුතු වේ. | අයවැය සැලැස්මේ ඇතුළත් ව්‍යාපෘති ක්‍රියාත්මක කරමින් පවතී. | මේ දක්වාම එම අරමුදල් සංවර්ධන ව්‍යාපෘති වෙනුවෙන් උපයෝජනය කර නොතිබුණි. |